# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා විසින් 2015 මාර්තු මස 24 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 මාර්තු මස 16 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[338 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 51.00 යි. තැපැල් ගාස්තුව : රු. 30.00 යි.

එල්.ඩී.–ඕ. 20/2015

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනයන්.

**1.** (1) මේ පනත දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ 3, 4, 5, 6, 7, 8, 9, 11 (එමගින් ඇතුළත් කරන ලද 46 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව හැර), 17, 19, 20, 21, 23, 33, 34, 35, 36, 37 සහ 38 යන වගන්තිවල විධිවිධාන 2015 අප්‍රේල් මස 22 වන දින බලාත්මක විය යුතු අතර අනිකුත් වගන්තිවල විධිවිධාන මේ පනත ක්‍රියාත්මක වන දින දී බලාත්මක විය යුත්තේ ය.

(3) මේ පනතේ 11 වන වගන්තියේ විධිවිධාන, ඒවා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවට අදාළවන තාක් දුරට, මේ පනත ක්‍රියාත්මක වන දිනට ඉක්බිතිව ම පවත්වනු ලබන මහ මැතිරණය අවසන්වීමේ දී බලාත්මක විය යුත්තේ ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 14අ අලුත් ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.

**2.** (මේ පනතේ මින්මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එහි 14 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථාව ඇතුළත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"තොරතුරු වෙත ප්‍රවේශවීමේ අයිතිවාසිකම.

14අ. (1)සෑම පුරවැසියකුට ම -

(අ) රජය, අමාත්‍යාංශයක් හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ යම් නීතියක් මගින් හෝ යටතේ පිහිටුවනු ලැබූ හෝ ඇතිකරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක්;

(ආ) යම් පළාත් අමාත්‍යාංශයක් හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් මගින් පිහිටුවනු ලැබූ හෝ ඇතිකරනු ලැබූ යම් දෙපාර්තමේන්තුවක් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක්;

(ඇ) යම් පළාත් පාලන ආයතනයක්; සහ

(ඈ) වෙනත් යම් තැනැත්තකු,

සතුව පවත්නා වූ ද, පුරවැසියකුගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා හෝ සුරක්ෂිත කිරීමෙහිලා අවශ්‍ය වන්නා වූ ද යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

(2) ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාව හෝ මහජන ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ද, විෂමාචාර හෝ අපරාධ වැළැක්වීම පිණිස ද, සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිස ද, අන් අයගේ කීර්තිය හෝ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස ද, පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම පිණිස ද, විශ්වාසය මත ලබාදෙන ලද තොරතුරු හෙළිදරව් කිරීම වැළැක්වීම පිණිස ද හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාම පිණිස ද, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය වන්නා වූ නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හැර වෙනත් කවර හෝ සීමාකිරීමක් මේ ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති අයිතිවාසිකම මත නොපැනවිය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ 'පුරවැසියා' යන්නට, යම් ව්‍යවස්ථාපිත වූ හෝ ව්‍යවස්ථාපිත නොවූ මණ්ඩලයක සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් පුරවැසියන් වන්නේ නම්, එවැනි මණ්ඩලයක් ඇතුළත් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

**3.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ :-

"ජනරජයේ ජනාධිපතිවරයා

30. (1) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයෙක් වන්නේ ය. ජනාධිපතිවරයා රජයේ ප්‍රධානයා ද විධායකයේ ප්‍රධානයා ද ආණ්ඩුවේ ප්‍රධානයා ද සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකවරයා ද වන්නේ ය.

(2) ජනරජයේ ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර පස් අවුරුදු කාලයක් ධූරය දරන්නේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**4.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනු ව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන් :-

"(2) ජනතාව විසින් ජනාධිපති ධූරයට දෙවරක් තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තකු ජනතාව විසින් නැවත එකී ධූරය සඳහා තෝරා පත් කර ගනු ලැබීමට සුදුස්සකු නොවන්නේ ය";

(2) එකී ව්‍යවස්ථාවේ (3අ) අනු ව්‍යවස්ථාවේ -

(අ) (i) (අ) (i) ඡේදයේ "තම අභිලාෂය, තම වත්මන් ධූර කාලය ආරම්භ වී අවුරුදු හතරක් ඉකුත්වීමෙන් පසු යම් අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැක්කේ ය." යන වචන වෙනුවට "තම අභිලාෂය තම ප්‍රථම ධූර කාලය ආරම්භ වී අවුරුදු හතරක් ඉකුත්වීමෙන් පසු යම් අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැක්කේ ය" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) (අ) (i) ඡේදයේ අතුරු විධානය ඉවත් කිරීමෙන්;

(ආ) (ඇ) ඡේදයේ (iii) වන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"(iii) (i) වන අයිතමයෙහි සඳහන් මියයාමේ හේතුවෙන් ජනාධිපති ධූරයෙහි පුරප්පාඩුවක් පවත්නා විට ඒ පුරප්පාඩුව ඇති වීම හා නව ජනාධිපතිවරයා ධූරය භාර ගැනීම හා අතර කාලය තුළ කථානායකවරයා ජනාධිපති ධූරයෙහි වැඩ බැලිය යුත්තේ ය :

එසේ වුවද ඒ වනවිට කථානායක ධූරය හිස්ව පවතී නම් කථානායකවරයාට ජනාධිපති ධූරයේ වැඩ බැලීමට නොහැකි නම්, නියෝජ්‍ය කථානායකවරයා ජනාධිපති ධූරයෙහි වැඩ බැලිය යුත්තේ ය."; සහ

(ඇ) ඒ අනු ව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ "අවුරුදු හයක කාලයක්" යන වචන යෙදෙන කවර හෝ තැනක "අවුරුදු පහක කාලයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාවේ අතුරු විධානයෙහි (ආ) සහ (ඇ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :-

"(ආ) ජනාධිපතිවරයකු තෝරා පත්කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීමක දී එවකට ධූරය දරන ජනාධිපතිවරයා අපේක්ෂකයකු නොවන්නා වූ හෝ නැවත තේරී පත් නොවන්නා වූ හෝ අවස්ථාවක, ඔහුගේ ධූර කාලය, ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ පත් කරනු ලැබූ දිනයේ දී අවසන් වූවාක් සේ සැලකිය යුත්තේ ය. ඒ ඡන්ද විමසීමේ දී ජනාධිපතිවරයා ලෙස තෝරා පත් කර ගන්නා ලද තැනැත්තා අප්‍රමාදව එහෙත් ඒ දිනයේ සිට සති දෙකක් ඉකුත්වීමට පෙර, ධූරය භාරගත යුත්තේ ය ;

එසේ වුවද 30 වන ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශ කරනු ලැබූ තැනැත්තා ධූරයේ කටයුතු භාර ගන්නා තෙක්, එවකට ධූරය දරන ජනාධිපතිවරයා, ජනාධිපති ධූරයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුත්තේ ය; ඉටු කළ යුත්තේ ය. ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශ කරනු ලැබූ තැනැත්තා ධූරය භාර නොගැනීමේ හේතුවෙන් ජනාධිපති ධූරය හිස් වුවහොත් කථානායකවරයා හෝ ඒ අවස්ථාවේදී කථානායක ධූරය හිස් වුවහොත් නැතහොත් කථානායකවරයාට ජනාධිපති ධූරයේ වැඩ බැලීමට නොහැකි නම්, නියෝජ්‍ය කථානායකවරයා ජනාධිපති ධූරයේ වැඩ බැලීම ආරම්භ කරන තෙක්, එවකට ධූරය දරන ජනාධිපතිවරයා ජනාධිපති ධූරයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුත්තේ ය; ඉටු කළ යුත්තේ ය;

(ඇ) (අ) ඡේදයේ සඳහන් මියයාමේ හේතුවෙන් ජනාධිපති ධූයෙහි පුරප්පාඩුවක් පවතින අවස්ථාවක, එම පුරප්පාඩුව ඇතිවීම හා අලුත් ජනාධිපතිවරයා ධූරය භාර ගැනීම හා අතර කාලය තුළ කථානායකවරයා ජනාධිපති ධූරයෙහි වැඩ බැලිය යුත්තේ ය :

එසේ වුව ද, කථානායක ධූරය ඒ වන විට හිස්ව පවතී නම් හෝ කථානායකවරයාට ජනාධිපති ධූරයේ වැඩබැලීමට නොහැකි නම්, නියෝජ්‍ය කථානායකවරයා ජනාධිපති ධූරයෙහි වැඩ බැලිය යුත්තේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

**5.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ :-

'ජනාධිපතිවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

33. (1) ජනාධිපතිවරයා ජාතික සමගියේ සංකේතය විය යුත්තේ ය.

(2) (අ) ආණ්ඩුවේ සියලුම අංශයන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද ආරක්ෂා කරන බවට ද වගබලා ගැනීම;

(ආ) ආගමික හා ජනවාර්ගික සහජීවනය සුරක්ෂිත කිරීම, තහවුරු කිරීම හා පහසු කරලීම; සහ

(ඇ) ජාතික ප්‍රතිසන්ධානය හා ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ VIIඅ ව්‍යවස්ථාවේ සඳහන් ආයතනවල නිසි ක්‍රියාකාරීත්වය පහසුකරලීම; සහ

(ඉ) මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණ නිර්මාණය කිරීම තහවුරු කිරීම,

ජනාධිපතිවරයාගේ කාර්ය විය යුත්තේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් ලිඛිත නීතියකින් හෝ ප්‍රකාශිතවම ජනාධිපතිවරයා වෙත පවරා හෝ නියම කර ඇත්තා වූ බලතලවලට සහ කාර්යයන්ට අමතරව, ජනාධිපතිවරයාට -

(අ) පාර්ලිමේන්තුවේ එක් එක් සැසිවාරය ආරම්භයේ, පාර්ලිමේන්තුවේ දී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය කිරීමට බලය ඇත්තේ ය;

(ආ) පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම්වල මුලසුන දැරීමට බලය ඇත්තේ ය;

(ඇ) පාර්ලිමේන්තුව කැඳවීමට, වාර අවසන් කිරීමට සහ විසුරුවා හැරීමට බලය ඇත්තේ ය;

(ඈ) තානාපතිවරයන්, මහකොමසාරිස්වරයන්, පූර්ණාධිකාරී රාජ්‍ය දූතයන් හා වෙනත් තානාපති නියෝජිතයන් පත් කිරීමට හා ඔවුන්ට බලතල පැවරීමට ද, ඔවුන් පිළිගැනීමට ද බලය ඇත්තේ ය;

(ඉ) නීතිඥ වෘත්තියෙහි විශිෂ්ඨත්වයට පත්ව ඇත්තා වූ ද, පැවැත්මෙහි හා වෘත්තිය කටයුතු පිළිබඳ අවංකභාවයෙහි උත්කෘෂ්ඨ තත්වයක් පවත්වාගෙන ඇත්තාවූ ද නීතිඥවරයන්, ජනාධිපති නීතීඥවරයන් වශයෙන් පත් කිරීමට බලය ඇත්තේ ය. මේ ඡේදය යටතේ පත් කරනු ලබන සෑම ජනාධිපති නීතීඥවරයකුටම ඒ දක්වා රාජ නීතීඥවරයන් විසින් භුක්ති විඳින ලද සියලු වරප්‍රසාදවලට හිමිකම ඇත්තේ ය;

(ඊ) ජනරජයේ රාජ්‍ය මුද්‍රාව භාරයේ තබා ගැනීමට ද අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන් ද ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙකුත් විනිශ්චයකාරවරයන් ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ අනෙකුත් විනිශ්චයකාරවරයන් ද පත් කිරීමේ අධිකාර පත්‍රවල සහ ජනරජයට අයත් වූ ද ප්‍රදානය කිරීමට හා පවරා දීමට ජනාධිපතිවරයාට නීතියෙන් නියමව ඇත්තා වූ නැතහොත් බලය පැවරී ඇත්තා වූ ද ඉඩකඩම් හා අනෙකුත් නිශ්චල දේපළ ප්‍රදානය කිරීමේ දී හෝ පවරා දීමේ දී, ඒ සම්බන්ධ ප්‍රදාන ප්‍රත්‍රවල හා පැවරුම් පත්‍රවල රාජ්‍ය මුද්‍රාව තබා, අත්සන් කිරීමට ද රාජ්‍ය මුද්‍රාව තැබිය යුතු වෙනත් සෑම ලේඛනයකම රාජ්‍ය මුද්‍රාව තබා අත්සන් කිරීමට ද බලය ඇත්තේ ය;

(උ) යුද්ධය ප්‍රකාශ කිරීමට හා සාමය ප්‍රකාශ කිරීමට බලය ඇත්තේ ය; සහ

(ඌ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට පටහැනි නොවන්නා වූ ද ජාත්‍යන්තර නීතිය, චාරිත්‍ර වාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටු කිරීමට ජනාධිපතිවරයාට බලය ලැබී ඇත්තා වූ හෝ නියමිතව ඇත්තා වූ ද සියලු ක්‍රියා හා දේ කිරීමට බලය ඇත්තේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33අ වගන්තිය ඇතුළත් කිරීම.

**6.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන ව්‍යවස්ථාව මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33අ ව්‍යවස්ථාව ලෙස බලපැවැත්විය යුතු ය :-

"ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගවිය යුතු බව.

33අ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිය ඇතුළු යම් ලිඛිත නීතියක් යටතේ ද ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම සහ යථා පරිදි ඉටුකිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

**7.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ :-

"ජනාධිපතිවරයාට විරුද්ධව නඩු පැවරිය නොහැකි බව.

35. (1) යම් තැනැත්තකු ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා ලෙස ධූරය දරන අවස්ථාවක දී, ඔහු හෝ ඇය විසින් පෞද්ගලික තත්ත්වයෙහි ලා හෝ නිල තත්ත්වයෙහි ලා කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ඔහුට හෝ ඇයට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පැවරීම හෝ පවත්වාගෙන යාම හෝ නොකළ යුත්තේ ය :

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් ඔහුගේ හෝ ඇයගේ නිල තත්වයෙහි ලා කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් නීතිපතිවරයාට විරුද්ධව 126 වන ව්‍යවස්ථාව යටතේ ඉල්ලීමක් කිරීමට යම් තැනැත්තකුට ඇති අයිතිය සීමා කරන ලෙස මේ අනුව්‍යවස්ථාවේ කිසිවක්, කියවා තේරුම් නොගත යුත්තේ ය :

එසේම තවදුරටත්, ජනාධිපතිවරයා විසින් 33(උ) ව්‍යවස්ථාව යටතේ බලතල ක්‍රියාත්මක කිරීම මත ප්‍රශ්නාපනය කිරීමට, ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ බලය නොතිබිය යුත්තේ ය.

(2) කවර වූ හෝ තැනැත්තකුට විරුද්ධව, කවර හෝ විස්තරයක නඩුවක් පැවරිය හැකි කාලය සීමා කරමින් නීතියෙන් විධිවිධාන සකසා ඇති විට, ඒ තැනැත්තා යම් කිසි කාලයක් ශ්‍රී ලංකා ජනරජයේ

ජනාධිපති ධුරය දරා ඇත්නම් එකී නඩුව පැවරිය හැකි කාලසීමාව ලෙස නීතියෙන් නියමව ඇති කාලය නිශ්චය කිරීමේ දී ඒ තැනැත්තා ජනාධිපති ධුරය දැරූ කාලය නොගැනිය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලින් පැවරී ඇති මුක්තිය, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම හා සම්බන්ධව හෝ ජනමත විචාරණයක වලංගුභාවය හා සම්බන්ධව 130 වන ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලට අදාළ නොවන්නේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 37 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

**8.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 37 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ :-

"වැඩබලන ජනාධිපතිවරයා.

**37.** (1) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ජනාධිපති ධුරයට අයත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීමට ජනාධිපතිවරයාට නොහැකිවන කවර හෝ අවස්ථාවක, කථානායකවරයා එකී කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති ධුරයේ වැඩ බැලිය යුත්තේ ය. කථානායකවරයාගේ ධුරය ඒ අවස්ථාව වන විට හිස්ව පවතී නම් හෝ කථානායකවරයාට වැඩ බැලීමට නොහැකි නම්, නියෝජ්‍ය කථානායකවරයා ජනාධිපති ධුරයේ වැඩ බැලිය යුත්තේ ය.

(2) (32 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන හැර) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන, එසේ ජනාධිපති ධුරයෙහි වැඩ බලන තැනැත්තාට, අදාළ කළ හැකිතාක් දුරට අදාළ වන්නේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 39 වන සහ 40 වන ව්‍යවස්ථා ප්‍රතියෝජනය කිරීම.

**9.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 39 වන සහ 40 වන ව්‍යවස්ථා මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථා ආදේශ කරනු ලැබේ :-

"ජනාධිපතිවරයා යථා පරිදි තෝරා පත්කර ගෙන නොමැති බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කිරීම.

39. (1) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 130 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා -

(අ) ජනාධිපතිවරයා තෝරා පත් කිරීම නිශ්ප්‍රභ බව තීරණය කළ සහ වෙනත් යම් කිසි තැනැත්තකු යථා පරිදි තෝරාපත්කර ගන්නා ලදැයි තීරණය නොකළ අවස්ථාවක, ජනාධිපති ධූරයෙහි පුරප්පාඩුවක් ඇති වූ බවට සලකනු ලැබිය යුතු අතර ඒ තීරණය කරනු ලැබූ දින සිට එක් මාසයක් ඉකුත්වීමට පෙර 40 වන ව්‍යවස්ථාවට අනුකූලව ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඡන්ද විමසීමක් පවත්වනු ලැබිය යුත්තේ ය; හෝ

(ආ) වෙනත් යම් තැනැත්තකු ජනාධිපතිවරයා ලෙස යථා පරිදි තෝරා පත්කර ගන්නා ලද බව තීරණය කළ අවස්ථාවක ඒ තීරණය කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළත ඒ වෙනත් තැනැත්තා ජනාධිපති ධූරය භාර ගත යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් වන පරිදි වූ යම් තීරණයක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලැබූ විට, ජනාධිපති ධූරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කරමින් හෝ ඉටු කරමින් සිටි තැනැත්තා ඒ බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම අප්‍රමාදව නතර කළ යුත්තේ ය. එකී තීරණයේ දිනයත් නව ජනාධිපතිවරයා ධූරය භාර ගැනීමත් අතර කාලය තුළ කථානායකවරයා ජනාධිපති ධූරයේ වැඩ බැලිය යුත්තේ යඃ

එසේ වුවද, ඒ අවස්ථාව වන විට කථානායක ධූරය හිස්ව පවතී නම් හෝ කථානායකවරයාට ජනාධිපති ධූරයේ වැඩ බැලීමට නොහැකි නම් නියෝජ්‍ය කථානායකවරයා ජනාධිපති ධූරයේ වැඩ බැලිය යුත්තේ ය.

(3) 31 වන ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව ඇත ද, 30 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ කාර්යය සඳහා, නව ජනාධිපතිවරයාගේ ධූර කාලය, යම් තැනැත්තකු, තෝරා පත්කර ගනු ලැබීම නිශ්ප්‍රභ හෝ අනිසි බවට තීරණය කරනු ලැබුවේ ද එම තීරණය නොකරන ලද නම් ඒ තැනැත්තාගේ ධූර කාලය ආරම්භ විය හැකිව තිබුණු දිනයේ දී, ආරම්භ වූවාක් සේ සැලකෙන්නේ ය.

(4) ජනාධිපති ධූරයේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම, ජනාධිපතිවරයා වශයෙන් ඒ තැනැත්තා තෝරා පත්කර ගැනීම නිශ්ප්‍රභ බව හෝ අනිසි බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පසු අවස්ථාවක දී තීරණය කරනු ලැබූ පමණින්, නිර්බල නොවිය යුත්තේ ය.

(5) 40 වන ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ වන්නේ ය.

ජනාධිපතිවරයා විසින් ධූරය හිස් කිරීම සහ අනුප්‍රාප්තිකයා තෝරා පත්කිරීම.

40. (1) (අ) ජනාධිපතිවරයාගේ ධූරය, ඔහුගේ හෝ ඇයගේ ධූරකාලය ඉතුත් වීමට පෙර හිස් වුවහොත්, පාර්ලිමේන්තුව විසින් එහි මන්ත්‍රීවරයන් අතුරෙන් ජනාධිපති ධූරයට තෝරා පත් කර ගනු ලැබීමට සුදුසුකම් ඇති යම් මන්ත්‍රීවරයකු ජනාධිපතිවරයා ලෙස තෝරා පත්කර ගනු ලැබිය යුත්තේ ය. ජනාධිපති ධූරයට එසේ අනුප්‍රාප්ත වන යම් තැනැත්තකු, ධූරය හිස් කරන ජනාධිපතිවරයාගේ ධූර කාලයේ ඉතිරි කාලය තුළ පමණක් ධූරය දැරිය යුත්තේ ය.

(ආ) එසේ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම, පුරප්පාඩුව ඇති වූ දිනයෙන් පසු හැකිතාක් ඉක්මණින් කළ යුත්තේ ය. එම තෝරා පත්කර ගැනීම කිසිම අවස්ථාවක දී එදින සිට මාසයකට වඩා පසු නොවිය යුත්තේ ය. එම තෝරා පත්කර ගැනීම පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සලස්වනු ලැබිය හැකි

යම් කාර්ය පටිපාටියකට අනුකූලව රහස් ඡන්දයෙන් හා දෙන ලද ඡන්ද සංඛ්‍යාවෙන් ඒකාන්ත බහුතර ඡන්දයකින් විය යුත්තේ ය :

එසේ වුව ද පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව එවැනි පුරප්පාඩුවක් ඇතිවුවහොත්, නව පාර්ලිමේන්තුව විසින්, ඒ පාර්ලිමේන්තුවේ පළමු රැස්වීමේ දින සිට එක් මාසයක් ඇතුළත ජනාධිපතිවරයා තෝරා පත් කොට ගත යුත්තේ ය.

(ඇ) ධූරය එසේ හිස්වීමත් නව ජනාධිපතිවරයා ධූරයේ කාර්ය භාර ගැනීමත් අතර කාලය තුළ කථානායකවරයා ජනාධිපති ධූයේ වැඩ බැලිය යුත්තේ ය :

එසේ වුව ද ඒ අවස්ථාව වන විට කථානායක ධූරය හිස්ව පවතී නම් හෝ කථානායකවරයාට ජනාධිපති ධූරයේ වැඩ බැලීමට නොහැකි නම්, නියෝජ්‍ය කථානායකවරයා ජනාධිපති ධූරයේ වැඩ බැලිය යුත්තේ ය.

(2) (32 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන හැර) ජනාධිපතිවරයාට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ කළ හැකිතාක් දුරට, වැඩ බලන ජනාධිපතිවරයකුට ද අදාළ වන්නේ ය.

(3) පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා වූ කාර්ය පටිපාටිය පිළිබඳ සියලු කාරණා සඳහා ද, ඊට අවශ්‍ය හා ආනුෂංගික වෙනත් සියලු කාරණා සඳහා ද පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් එසේ විධිවිධාන සළස්වන තෙක්, 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ (විශේෂ විධිවිධාන) පනත ඒ තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුත්තේ ය.”.

**10.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය ප්‍රතියෝජනය කිරීම.

"VIIඅ පරිච්ඡේදය

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය.

41අ. (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන, (මේ පරිච්ඡේදයේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් තිබිය යුත්තේ ය :-

(අ) අග්‍රාමාත්‍යවරයා;

(ආ) කථානායකවරයා;

(ඇ) පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා;

(ඈ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු එක් තැනැත්තෙක්;

(ඉ) අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාගේ ම නාම යෝජනා කිරීම මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පස් දෙනෙක්; සහ

(ඊ) අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ නොවන පාර්ලිමේන්තුවේ නියෝජනය ඇති අනෙකුත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාම යෝජනා කොට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් තැනැත්තෙක්.

(2) කථානායකවරයා සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදය හෝ (ඊ) ඡේදය යටතේ වන පත්කිරීම් සඳහා වූ නාම යෝජනා, ඒ නාම යෝජනා කිරීමේ අවශ්‍යතාවය පැනනගින කවර හෝ අවස්ථාවන්හිදී සිදු කිරීමට වගබලා ගැනීම කථානායකවරයාගේ කාර්යය වන්නේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ සඳහන් තැනැත්තන් පස් දෙනා නම් කිරීමේ දී අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් වෘත්තීය සහ සමාජීය විවිධත්වය ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුවාර්ගික ලක්ෂණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් පිළිබිඹුවන බව සහතික වීම පිණිස, පාර්ලිමේන්තුවේ නියෝජනය වන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයන් විමසිය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ අවස්ථාවෝචිත පරිදි (ඇ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ පත් කරනු ලබන හෝ නම් කරනු ලබන තැනැත්තෝ, විශිෂ්ටත්වයෙන් හා අවංක භාවයෙන් යුත්, පොදු වෘත්තීය ජීවිතයේ දී කීර්තිය ලත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයන් නොවන තැනැත්තන් විය යුත්තාහ.

(6) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) සහ (ඊ) ඡේද යටතේ කරන ලද නාම යෝජනා නිශ්චිතව දක්වමින් ලිඛිත දැනුම්දීමක් ජනාධිපතිවරයා වෙත ලැබී දින දහහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින් ඒ අවශ්‍ය පත්කිරීම් කරනු ලැබිය යුත්තේ ය. එකී දින දහහතරක කාල පරිච්ඡේදය ඇතුළත අවශ්‍ය පත්කිරීම් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත්වන විටෙක, නාම යෝජිත තැනැත්තන්, එකී කාල පරිච්ඡේදය අවසන් වූ දින සිට බලපවත්වන පරිදි සභාවේ සාමාජිකයන් ලෙස පත්කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද, පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ විටක, ඉහත කී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු කථානායකවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා තෙක්, ඒ දක්වා සිටි කථානායකවරයා සභාවේ සාමාජිකයකු ලෙස තවදුරටත් ධූරය දැරිය යුත්තේ ය.

ආ) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, ඉන් ඉක්බිතිව ම පවත්වන ලද මහා මැතිවරණයෙන් පසුව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු අවස්ථාවෝචිත පරිදි අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරන ලබන තෙක් හෝ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස පිළිගනු ලබන තෙක්, ඒ දක්වා සිටි අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා සභාවේ සාමාජිකයන් ලෙස තවදුරටත් ධූර දැරිය යුත්තාහ.

(8) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය, (ඉ) අනුඡේදය සහ (ඊ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සෑම සාමාජිකයකු ම විසින්, ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් ඔහුගේ හෝ ඇයගේ ධූරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ඔහුට හෝ ඇයට තම ධූරයේ කටයුතු තවදුරටත් කරගෙන යාමට නොහැකි ශාරීරික හෝ මානසික අශක්නුතාවයකට පත්ව ඇති බවට අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාම මතයක් ඇති කර ගන්නා අවස්ථාවක ඒ මත ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු හෝ ඇය වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු හෝ ඇය විෂයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම් හෝ 41ඉ ව්‍යවස්ථාවේ (7) වන අනු ව්‍යවස්ථාව යටතේ ඔහු

හෝ ඇය, සිය ධූරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු හෝ ඇය පත් කරනු ලැබූ දින සිටි අවුරුදු පහක කාලයක් ධූරය දැරිය යුත්තේ ය.

(9) මේ ව්‍යවස්ථාවේ (1) අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය, (ඉ) ඡේදය හෝ (ඊ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන් අතර පුරප්පාඩුවක් ඇති වූ විටක, එම පුරප්පාඩුව ඇතිවීමේ දින සිට සති දෙකක් ඇතුළත, ඉහත සඳහන් ඡේදයන්හි විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්තවීම පිණිස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුත්තේ ය. එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තෙක්, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව තිබෙන කොටස සඳහා ධූරය දරන්නේ ය.

(10) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය, (ඉ) ඡේදය හෝ (ඊ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු, එම ඡේද යටතේ නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

(11) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය, (ඉ) ඡේදය සහ (ඊ) ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලබන පත්වීම් කථානායකවරයාට දැනුම් දිය යුත්තේ ය.

සභාව විසින් පත් කිරීම නිර්දේශ කළ යුතු බව

41ආ. (1) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස හෝ ජනාධිපතිවරයා විසින් තැනැත්තනු පත් කිරීම සභාවේ නිර්දේශය මත හැර, නොකරනු ලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන, එකී යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස වැඩබැලීම සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස හෝ සාමාජිකයන් ලෙස පත් කිරීම සඳහා අවස්ථාව එළඹෙන කවර හෝ විටක එසේ පත් කරනු ලැබිය යුතු නිසි සහ යෝග්‍ය තැනැත්තන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම සභාවේ කාර්යයක් වන අතර ඒ නිර්දේශවලින් ලිංගික වර්ගීකරණය ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුවාර්ගික ස්වභාවය පිළිබිඹු වන බව වගබලා ගැනීමට ප්‍රයත්න දරනු ලැබිය යුත්තේ ය. ඒ කොමිෂන් සභාවල සභාපතිවරුන් සම්බන්ධයෙන් වන විට, පත් කිරීම සඳහා සභාව විසින් තැනැත්තන් තිදෙනෙකු නිර්දේශ කරනු ලැබිය යුතු අතර, නිර්දේශ කරනු ලැබූ තැනැත්තන්ගෙන් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

(4) පත් කිරීම් සඳහා සභාවේ නිර්දේශය ලැබුණු දින සිට දින දහහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයන් පත් කරනු ලැබිය යුත්තේ ය.

එකී දින දහහතරක කාල පරිච්ඡේදය තුළ අවශ්‍ය පත් කිරීම් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත්වූ විටක, එකී කාල පරිච්ඡේදය අවසන් වන දින සිට බලපැවැත්වෙන පරිදි :-

(අ) (3) වන අනුව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු ලැබූ තැනැත්තන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත්කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) (3) වන අනුව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරන ලද නම් ලැයිස්තුවේ ප්‍රථමයෙන් නම් දැක්වෙන තැනැත්තන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන යම් තැනැත්තකු හෝ කොමිෂන් සභාවක සභාපතිවරයාගේ හෝ සාමාජිකයකුගේ වැඩ බැලීම සඳහා පත් කරන ලද තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවල සලසා තිබෙන පරිදි හැර ඉවත් කරනු නොලැබිය යුත්තේ ය. එවැනි විධිවිධානයක් නොමැති අවස්ථාවක දී ඒ තැනැත්තා සභාවේ පූර්ව අනුමතය ඇතිව පමණක් ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

**උපලේඛනය**

(අ) මැතිවරණ කොමිෂන් සභාව;

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව;

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව;

(ඈ) විගණන සේවා කොමිෂන් සභාව;

(ඉ) ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව;

(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව;

(උ) මුදල් කොමිෂන් සභාව;

(ඌ) සීමා නිර්ණය කොමිෂන් සභාව;

(එ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව;

(ඒ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව;

(ඔ) රාජ්‍ය භාෂා කොමිෂන් සභාව.

පත්කිරීම්, සභාව විසින් අනුමත කළ යුතු බව.

41ඇ. (1) ජනාධිපතිවරයා විසින් සභාවට කරන ලද නිර්දේශයක් මත, සභාව විසින් අනුමත කර ඇත්නම් මිස, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කිසිම ධූරයකට ජනාධිපතිවරයා විසින් කිසිදු තැනැත්තකු පත් කරනු නොලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් ධූරයක දින දහහතරකට වැඩි කාලයක් වැඩ බැලීම සඳහා පත් කරනු ලබන යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය :

එසේ වුවද, දින දහහතරක් නොඉක්මවන අනුක්‍රමික කාලසීමා සඳහා එවැනි කවර හෝ ධූරයක වැඩබැලීමට යම් තැනැත්තකු පත් කිරීම ජනාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශ මත සභාව විසින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, නොකළ යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කවර හෝ ධූරයකට පත් කරනු ලැබූ කිසිදු තැනැතත්කු හෝ ඒ ධූරයකට පත් කරන ලද තැනැත්තකු වෙනුවෙන් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියකින් හෝ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, එකී ධූරයෙන් ඉවත් කරනු නොලැබිය යුත්තේ ය.

(4) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් සහ අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් පත් කිරීම හා සම්බන්ධ කර්තව්‍ය ඉටු කිරීමේ දී, සභාව විසින් අග්‍ර විනිශ්චයකාරවරයාගේ, අධිකරණ විෂයය භාර අමාත්‍යවරයාගේ, නීතිපතිවරයාගේ සහ ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ සභාපතිවරයාගේ අදහස් ලබාගත යුත්තේ ය.

උපලේඛනය

**I වන කොටස**

(අ) අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(ආ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්.

**II කොටස**

(අ) නීතිපතිවරයා;

(ආ) විගණකාධිපතිවරයා;

(ඇ) පොලිස්පතිවරයා;

(ඈ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්)වරයා;

(ඉ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා.

සභාවේ මහලේකම්වරයා සහ අනෙකුත් නිලධරයන්.

41ඈ. (1) සභාවට මහලේකම්වරයකු සිටිය යුත්තේ ය. මහලේකම්වරයා සභාව විසින් අවුරුදු පහක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුත්තේ ය. මහ ලේකම්වරයා ඔහුගේ හෝ ඇයගේ ධූර කාලය අවසන් වීමෙන් පසු නැවත පත්කරනු ලැබීමට සුදුසු වන්නේ ය.

(2) එහි කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන යම් නිලධරයන්, සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු නියමන් සහ කොන්දේසි මත සභාව විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

සභාවේ රැස්වීම්.

41ඉ. (1) සභාව විසින් සෑම මාසයකම යටත් පිරිසෙයින් දෙවාරයක් ද, එය වෙත මේ පරිච්ඡේදයේ විධිවිධාන මගින් හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ පවරා ඇති කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි තාක් වාර ගණනක් ද රැස්විය යුතු අතර සභාවේ සභාපතිවරයාගේ විධානය මත සභාවේ මහලේකම්වරයා විසින් ඒ රැස්වීම් කැඳවනු ලැබිය යුත්තේ ය.

(2) සභාපතිවරයා, සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවකදී අග්‍රාමාත්‍යවරයා ද අග්‍රාමාත්‍යවරයා පැමිණ නොමැති අවස්ථාවක දී විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් ද සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය. සභාපතිවරයා, අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන සියලු දෙනාම යම් රැස්වීමකට පැමිණ නොමැති අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරාගනු ලැබිය යුත්තේ ය.

(3) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය.

(4) සභාව විසින් කරනු ලැබිය යුතු සෑම නිර්දේශයක් හෝ අනුමත කිරීමක් ද ගනු ලැබිය යුතු සෑම තීරණයක් ද ඒකමතික තීරණයක් මගින් කිරීමට සභාව විසින් උත්සාහ දරනු ලැබිය යුත්තේ ය. ඒකමතික තීරණයක් නොමැති අවස්ථාවක දී සභාවේ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් සනාථ කළහොත් මිස, සභාව විසින් කරන ලද යම් නිර්දේශයක් හෝ අනුමත කිරීමක් හෝ ගනු ලැබූ යම් තීරණයක් හෝ බලසහිත නොවිය යුත්තේ ය.

(5) සභාපතිවරයාට මුල් ඡන්දයක් නොමැති නමුත් සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු යම් ප්‍රශ්නයක් සඳහා සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවකදී සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුත්තේ ය.

(6) 41ආ හෝ 41ඇ ව්‍යවස්ථා යටතේ යම් පත්කිරීමක් සඳහා යෝග්‍ය තැනැත්තන් නිර්දේශ කිරීමේදී හෝ අනුමත කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද ඇතුළුව සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වලදී කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සභාව විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(7) 41අ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ), (ඉ) හෝ (ඊ) ඡේද යටතේ පත් කරනු ලැබූ සභාවේ යම් සාමාජිකයකු සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණ සිටි අවස්ථාවක දී ඒ සාමාජිකයා ඒ තෙවන රැස්වීමේ දින සිට බලාත්මක වන පරිදි ධූරය අත්හරිනු ලැබුවාක් සේ සැලකිය යුත්තේ ය.

(8) සභාව පූර්ණ වශයෙන් සංස්ථාපිත නොවුව ද, සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබුන ද ඒ බව නොතකා ක්‍රියාකිරීමට සභාවට බලය ඇති අතර සභාව පූර්ණ වශයෙන් සංස්ථාපිත නොවීමේ හේතුව හෝ සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබීමේ හේතුව හෝ නිසාම පමණක් සභාවේ යම් ක්‍රියාවක්, කෘත්‍යයක් හෝ තීරණයක් අවලංගු නොවන්නේය. අවලංගු වන ලෙස නොසැලකිය යුත්තේ ය.

සභාවේ සාමාජිකයන් තවදුරටත් ධූර දැරීම.

41ඊ. සභාවේ සාමාජිකයන්ගේ හෝ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සාමාජිකයන්ගේ හෝ ධූර කාල ඉකුත්වීම නොතකා අවස්ථාවෝචිත පරිදි සභාවේ හෝ ඒ වෙනත් කොමිෂන් සභාවල හෝ අලුත් සාමාජිකයන් ධූර භාරගන්නා තෙක් ඒ දක්වා සිටි

සභාවේ හෝ ඒ වෙනත් කොමිෂන් සභාවල සාමාජිකයෝ තවදුරටත් ධූර දැරිය යුත්තාහ.

සභාවේ බලතල හා කාර්ය.

41උ. (1) සභාව විසින් සෑම මාස තුනකටම වරක් ඊට පෙරාතුව වූ මාස තුන තුළ එහි කටයුතු පිළිබඳව වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් පනවනු ලැබිය හැකි පරිදි වූ හෝ පවරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් කාර්ය සහ කර්තව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කිරීමද ඉටු කිරීම ද කරනු ලැබිය යුත්තේ ය.

(3) ස්වකීය කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරිමට අදාළව රීති සෑදීමට සභාවට බලය ඇත්තේ ය. එකී සියළු රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර පාර්ලිමේන්තුව ඉදිරිපත් කළ යුත්තේ ය.

සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බව.

41උඑ. සභාව විසින් දරනු ලබන වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

සභාවේ තීරණවල අවසානාත්මක භාවය.

41ඌ. 126 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, සභාව විසින් එළඹෙන ලද යම් තීරණයක් හෝ කරන ලද යම් අනුමත කිරීමක් හෝ නිර්දේශයක් භාර ගැනීමට, විභාග කිරීමට ඒ පිළිබඳ තීරණයක් දීමට හෝ කවර වූ හේතුවක් මත හෝ කවර වූ හෝ අන්‍යාකාරයකින් ප්‍රශ්න කිරීමට, කිසිදු අධිකරණයකට බලය හෝ අධිකරණ බලය නොමැති විය යුත්තේ ය. එකී තීරණය, අනුමතය හෝ නිර්දේශය සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII වන පරිච්ඡේදය ප්‍රතියෝජනය කිරීම.

11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII වන පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ :-

## "VIII වන පරිච්ඡේදය

### විධායකය

### අමාත්‍ය මණ්ඩලය

අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය.

42. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත් ව ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙයවීම සහ ඒ පාලනය පිළිබඳ විධානය භාර අමාත්‍ය මණ්ඩලයක් වන්නේ ය.

(2) අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට සහ උත්තර බැඳීමට බැඳී සිටින්නේ ය.

(3) අග්‍රාමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානයා වන්නේ ය.

(4) ජනාධිපතිවරයාගේ මතය අනුව පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම පමණින් ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

අමාත්‍යවරයන් සහ ඔවුන්ගේ විෂය සහ කාර්ය.

43. (1) අග්‍රාමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව ද අමාත්‍යාංශ සහ එකී අමාත්‍යවරයන්ට පවරන විෂය සහ කාර්ය ද නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.

(2) ජනාධිපතිවරයා, එසේ නිශ්චය කරනු ලබන අමාත්‍යාංශ භාරව කටයුතු කිරිම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් අතුරෙන් අමාත්‍යවරයන් පත් කළ යුත්තේ ය.

(3) අග්‍රාමාත්‍යවරයා විසින් කවර වේලාවක දී වුව ද, අමාත්‍ය මණ්ඩලය වෙත පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම සඳහා ජනාධිපතිවරයාට නිර්දේශ කිරීම කරනු ලැබිය හැක්කේ ය. අමාත්‍ය මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට සහ පාර්ලිමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩලය දරන වගකීමේ අඛණ්ඩ

පැවැත්මට එවැනි වෙනස් කිරීමක් බල නොපාන්නේ ය.

අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්.

44. (1) ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, පාර්ලිමේන්තුවේ මන්ත්‍රිවරයන් අතුරෙන් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන අමාත්‍යවරයන්ට පැවරිය යුතු විෂය සහ කාර්ය ද එකී අමාත්‍යවරයන්ට යම් අමාත්‍යාංශ භාර කරනු ලබන්නේ නම් ඒ අමාත්‍යාංශ ද අග්‍රාමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.

(3) අග්‍රාමාත්‍යවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ කරන යම් භාර කිරීමක් කවර වූ හෝ විටක වෙනස් කරනු ලැබිය හැක්කේ ය.

(4) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන සෑම අමාත්‍යවරයෙක්ම අමාත්‍ය මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටින්නේ ය.

(5) අමාත්‍ය මණ්ඩලයේ කවර වූ හෝ අමාත්‍යවරයකු විසින් ඔහු හෝ ඇය වෙත පැවරී ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලයක් හෝ කාර්යයක් හෝ යම් කිසි ලිඛිත නීතියකින් ඔහුට හෝ ඇයට පැවරී ඇත්තා වූ හෝ නියම වී ඇත්තා වූ යම් බලයක් හෝ කාර්යයක් අග්‍රාමාත්‍යවරයාගේ ඉල්ලීම මත, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට පවරා දිය හැකි අතර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාට එකී බලය හෝ කාර්යය පවරන්නා වූ හෝ නියම කරන්නාවූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද මේ අනුව්‍යවස්ථාව යටතේ එකී වෙනත් අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලැබූ

යම් බලයක් හෝ කාර්යයක් ඔහු හෝ ඇය විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

නියෝජ්‍ය අමාත්‍යවරයන්.

45. (1) ජනාධිපතිවරයා විසින්, අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ට ඔවුන්ගේ කාර්ය ඉටු කිරීමෙහි ලා සහාය වීම පිණිස පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් නියෝජ්‍ය අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) අමාත්‍ය මණ්ඩලයේ කවර හෝ අමාත්‍යවරයකු විසින්, ඔහු හෝ ඇය වෙත පවරා ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලයක් හෝ කාර්යයක් හෝ යම් කිසි ලිඛිත නීතියකින් ඔහු හෝ ඇය හෝ වෙත පැවරී ඇත්තා වූ හෝ නියම කරනු ලැබ ඇත්තා වූ යම් බලයක් හෝ කාර්යයක් අග්‍රාමාත්‍යවරයාගේ ඉල්ලීම මත, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් යම් නියෝජ්‍ය අමාත්‍යවරයකුට පවරා දිය හැකි අතර එකී අමාත්‍යවරයාට එකී බලය හෝ කාර්යය පවරන්නා වූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වී තිබුන ද එකී නියෝජ්‍ය අමාත්‍යවරයා විසින්, එසේ පවරා දෙනු ලැබූ යම් බලයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව සහ ධූර කාලය සීමා කිරීම.

46. (1) (අ) අමාත්‍ය මණ්ඩලයේ මුළු අමාත්‍යවරයන් සංඛ්‍යාව තිහ නොඉක්මවිය යුතු ය;

(ආ) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාවේ එකතුව හතලිහ නොඉක්මවිය යුතු ය.

(2) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙක්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයෙක් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙක් -

(අ) අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවනු ලබන ලිපියක් මගින්, ඉවත් කරනු ලැබුවහොත්; හෝ

(ආ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වුවහොත්; හෝ

(ඇ) තවදුරටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නොවුවහොත් හෝ, මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම්තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවතින්නේද ඒ තාක් කල් ස්වකීය ධූරය දරන්නේ ය.

(3) මේ ව්‍යවස්ථාව බලාත්මකභාවයට පත් වූ ඉක්බිතිවම පවත්වනු ලබන මහ මැතිවරණයක අවසානයේ දී පාර්ලිමේන්තුවේ වැඩිම අසුන් සංඛ්‍යාව ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම ද දෙවන වැඩිම අසුන් සංඛ්‍යාව ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම ද ජාතික එක්සත් භාවයෙන් යුත් ආණ්ඩුවක් පිහිටුවීමට එකඟ වුවහොත්, එවැනි අවස්ථාවක දී (1) වන අනුව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුව ද, පාර්ලිමේන්තුව එවැනි වැඩි කිරීමට එකඟවන්නේ නම්, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව ද නියෝජ්‍ය අමාත්‍යවරයන් සංඛ්‍යාව ද එකී පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීමේ දිනයෙන් සති දෙකක් ඇතුළත, පිළිවෙලින් හතලිස් පහේ සිට පනස් පහ දක්වා වැඩිකළ හැක්කේ ය.

පාර්ලිමේන්තුව විසුරුවා ඇති කාලය තුළ අමාත්‍ය මණ්ඩලය.

47. (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන තෙක් ක්‍රියාකළ අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, දිගටම ක්‍රියා කළ යුතු අතර මහමැතිවරණය අවසාන වූ විට, එසේ ක්‍රියා කිරීම

නතර කළ යුත්තේ ය. ඒ අනුව අග්‍රාමාත්‍යවරයාද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෝ ද වෙනත් 46 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි ධූර දැරීම නතර වුවහොත් මිස, දිගටම ක්‍රියා කරන්නාහ.

(2) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහමැතිවරණය අවසානවීමත් අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා මිය ගියේ වුව ද, ධූරයෙන් ඉවත් කරනු ලැබුවේ වුව ද, අස්වූයේ වුව ද, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කරන්නේ ය. තවද අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත්කරනු ලැබිය හැක්කේ ය.

(3) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසානවීමත් අතර කාලය තුළ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු හෝ මිය ගිය විට, ධූරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ ඉල්ලා අස්වූ විට ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය භාරව කටයුතු කිරීම හෝ ඒ අමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට වෙනත් කවර වූ හෝ අමාත්‍යවරයකු ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත පත්කරනු ලැබිය හැක්කේ ය.

අමාත්‍ය මණ්ඩලය විසිරීම.

48. (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසානවීමත් අතර කාලය තුළ හැර, ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අග්‍රාමාත්‍යවරයා ධූරය දැරීම නතර වූ විට, 70 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවාහැර ඇතොත් මිස, අමාත්‍ය මණ්ඩලය

විසිරෙන්නේය. එසේ වූ විට ජනාධිපතිවරයා විසින් 42 වන, 43 වන, 44 වන සහ 45 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයකු ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද වෙනත් අමාත්‍යවරයන් ද නියෝජ්‍ය අමාත්‍යවරයන් ද පත් කළ යුත්තේ ය ඃ

එසේ වුව ද, ඉහත කී පරිදි අග්‍රාමාත්‍යවරයා ධූරය දැරීම නතර වීමෙන් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත්, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කරන්නේය. තවද අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත් කරනු ලැබිය හැක්කේ ය. තවද 47 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(2) පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ විසර්ජන පනත් කෙටුම්පත හෝ ප්‍රතික්ෂේප කළහොත් එවිට ද ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් සම්මත කළහොත් එවිට ද අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේය. එසේ වූ විට 70 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරාය විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත් මිස, ජනාධිපතිවරයා විසින් 42 වන, 43 වන, 44 වන සහ 45 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයෙක් ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද වෙනත් අමාත්‍යවරයන් ද නියෝජ්‍ය අමාත්‍යවරයන් ද පත් කළ යුත්තේ ය.

වැඩබලන අමාත්‍යවරයන් සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්.

**49.** අමාත්‍ය මණ්ඩලයේ යම් කිසි අමාත්‍යවරයකුට හෝ 44 වන ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලැබූ වෙනත් අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට හෝ ඔහුගේ හෝ ඇයගේ ධූරයේ කාර්ය ඉටුකිරීමට නොහැකි වුවහොත් එවිට එකී අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ හෝ වෙනත්

අමාත්‍යවරයාගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ධූරයේ වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත පාර්ලිමේන්තුවේ කවර වූ හෝ මන්ත්‍රීවරයකු පත් කිරීම කළ හැකි වන්නේ ය.

අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා.

50. (1) අමාත්‍ය මණ්ඩලයට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේය.

(2) අග්‍රාමාත්‍යයවරයාගේ විධානයන්ට යටත්ව අමාත්‍ය මණ්ඩලයේ කාර්යාලය භාරව කටයුතු කිරීමත් අග්‍රාමාත්‍යවරයා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ ඔහුට හෝ ඇයට පවරනු ලබන්නා වූ වෙනත් යම් කර්තව්‍ය හෝ කාර්ය ඉටුකිරීමත්, කිරීමත් ලේකම්වරයා විසින් කරන ලබන්නේ ය.

අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා.

51. (1) අග්‍රාමාත්‍යවරයාට, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(2) අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලය භාරව කටයුතු කිරීමත් අග්‍රාමාත්‍යවරයාගේ විධානයන්ට යටත්ව ඔහුගේ හෝ ඇයගේ ධූරයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම හා කිරීමත් ලේකම්වරයා විසින් කළ යුත්තේ ය.

අමාත්‍යාංශයන්හි ලේකම්වරයන්.

52. (1) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුගේ සෑම අමාත්‍යාංශයක්ම සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(2) අමාත්‍යාංශයක ලේකම්වරයා ඔහුගේ හෝ ඇයගේ අමාත්‍යවරයා භාරයේ ඇති ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ද වෙනත් ආයතන ද අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත්ව මෙහෙය වන්නේ ය.

(3) අමාත්‍යාංශයක ලේකම්වරයා ධූරය දැරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසිර ගිය විට හෝ ඒ අමාත්‍යාංශයේ

පැවැත්ම නතරවීමේ ප්‍රතිඵලය ඇති තීරණයක් 43 වන ව්‍යවස්ථාව හෝ 44 වන ව්‍යවස්ථාව යටතේ අග්‍රාමාත්‍යවරයා විසින් කරනු ලැබූ විටක හෝ නතර විය යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ ධුරය, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ ධුරය, විගණකාධිපතිවරයාගේ ධුරය, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) ධුරය, පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ ධුරය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, සහ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු නොවන ලෙස සැලකිය යුත්තේ ය.

**නිල ප්‍රතිඥාව සහ දිවුරුම.**

53. මේ පරිච්ඡේදයේ දැක්වෙන යම් කිසි ධුරයකට පත් කරනු ලැබූ සෑම තැනැත්තකුම ඔහු හෝ ඇය විසින් හතරවන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන්නේ නම් මිස හෝ දිවුරුම් දී ඊට අත්සන් තබන්නේ නම් මිස ස්වකීය ධුරයට අයත් කාර්යන්හි නොයෙදිය යුත්තේ ය.”.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.**

**12.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව පහත දක්වා ඇති පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

“(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත (මේ පරිච්ඡේදයෙහි “කොමිෂන් සභාව” යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් වන්නේ ය. ඒ සාමාජිකයන් අතුරෙන්

සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තාහ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.";

(2) එකී ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

"(4) කොමිෂන් සභාවේ සාමාජිකයකු මේ ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ නුසුදුසුවීමකට පාත්‍ර වුවහොත් හෝ ජනාධිපතිවරයා අමතා යවන ලියවිල්ලක් මගින්, නියමිත දිනට පෙරාතුව ධූරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබුව හොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධව අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු හෝ ඇය ප්‍රජා අශක්නුතාවන්ට යටත් කළ යුතු බවට යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාව යටතේ සම්මත කොට ඇත්නම් හෝ මේ ව්‍යවස්ථාවේ (6) වන අනු ව්‍යවස්ථාව යටතේ ධූරය හැර යන ලද සේ සලකනු ලැබුවහොත් හෝ මිස, ඔහු හෝ ඇය, පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධූර දරන්නේ ය.";

(3) එකී ව්‍යවස්ථාවේ (7) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

"(7) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට මාස දෙකක් නොඉක්මවන කාලයකට කොමිෂන් සභාවට අදාළ කාර්යවලින් නිවාඩු දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු, ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පත්කරනු ලැබිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**13.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 වන ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ "අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන" යන වචන වෙනුවට "කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන" යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**14.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 වන ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ "අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව නියම කරන" යන වචන වෙනුවට "කොමිෂන් සභාව විසින් නිශ්චිතව නියම කරන" යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61අ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**15.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61අ ව්‍යවස්ථාව, එකී ව්‍යවස්ථාවේ "126 වන ව්‍යවස්ථාවේ (1) වැනි, (2) වැනි, (3) වැනි, (4) වැනි සහ (5) වැනි ඡේදයන්හි විධිවිධානවලට යටත්ව" යන වචන වෙනුවට " 59 වැනි ව්‍යවස්ථාවේ සහ 126 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඉ සහ 61ඊ ව්‍යවස්ථා ප්‍රතියෝජනය කිරීම.

**16.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථවේ 61ඉ සහ 61ඊ ව්‍යවස්ථා මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථා ආදේශ කරනු ලැබේ :-

"ජනාධිපතිවරයා විසින් කරනු ලබන පත්කිරීම්

61ඉ. (1) ජනාධිපතිවරයා විසින් -

(අ) යුද හමුදාපතිවරයා, නාවුක හමුදාපතිවරයා සහ ගුවන් හමුදාපතිවරයා පත් කිරීම ද;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව නීතිපතිවරයා සහ පොලිස්පතිවරයා පත් කිරීම ද;

කළ යුත්තේ ය.

(2) නීතිපතිවරයාගේ සහ පොලිස්පතිවරයාගේ ධූර දරන්නන් වයස අවුරුදු හැට පිරීමේ දී ස්වකීය ධූර හැර යා යුත්තාහ.

අර්ථ නිරූපණය.

61ඊ. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා "රජයේ නිලධරයා" යන්නට යුද හමුදා, නාවුක හමුදා හෝ ගුවන් හමුදා සාමාජිකයකු හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයකු හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරන ලද පොලිස් නිලධරයකු හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපලේඛනගත රජයේ නිලධරයකු හෝ විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලද, ශ්‍රී ලංකා විගණන සේවයේ සාමාජිකයකු හෝ ඇතුළත් නොවන්නේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**17.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62 වන ව්‍යවස්ථාවේ එකී ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(2) සෑම පාර්ලිමේන්තුවක්ම පළමුවරට රැස්වීමට නියමිත දින පටන් පස් අවුරුද්දකට නොවැඩි කාලයක් පවත්නේය. එහෙත් නියමිත කාල සීමාව ඉකුත්වීමට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ ය. එකී පස් අවුරුදු කාලය ඉකුත්ව ගිය විට ම පාර්ලිමේන්තුව විසිර ගියාක් සේ සැලකෙන්නේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**16.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

"(1) පාර්ලිමේන්තුවේ මහලේකම්වරයෙක් වන්නේය. මහලේකම්වරයා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව පත්කරනු ලබන්නේය. මහලේකම්වරයා යථා පැවැත්මෙන් සිටිනාතාක් ස්වකීය ධූරය දරන්නේ ය."; සහ

(2) එකී ව්‍යවස්ථාවේ (6) වන අනු ව්‍යවස්ථාව ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

"(6) මහලේකම්වරයාට සිය ධූරයේ කටයුතු ඉටු කිරීමට නොහැකි වූ විට මහලේකම්වරයා වෙනුවෙන් වැඩබැලීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව තැනැත්තකු පත් කිරීම ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**17.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(1) ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයක් මගින් පාර්ලිමේන්තුව කැඳවීම, පාර්ලිමේන්තුවේ වාරාවසාන කිරීම සහ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම කළ හැක්කේ ය:

එසේ වුවද, පාර්ලිමේන්තුව විසින් එහි නොපැමිණි මන්ත්‍රීවරයාද ඇතුලුව මුළු මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස ජනාධිපතිවරයාගෙන්

ඉල්ලීමක් කරනු ලබන්නේ නම් මිස, පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම සඳහා නියම කරගනු ලැබූ දිනයෙන් අවුරුදු හතරක් සහ මාස හයක කාලයක් අවසන් වන තෙක් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නොකල යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**20.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වන ව්‍යවස්ථාව එහි (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරිම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(1) සෑම පනත් කෙටුම්පතක් ම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යටත් පිරිසෙයින් දවස් දහහතරකට පෙර ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරිම.

**21.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 වන ව්‍යවස්ථාව, එකී ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව ඉවත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරිම.

**22.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාව එහි (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරිම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී ඡේදයේ (V), (Vඅ) සහ (Vඇ) අයිතම වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීම මගින් :-

"(v) 41අ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ), (ඉ) සහ (ඊ) ඡේදවල සඳහන් ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයකු;

(vඅ) 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සාමාජිකයකු;

(vආ) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා;";

(2) එකී ඡේදයේ (vii) වන අයිතමයේ "යම් ධූරයෙක් දරන්නා වූ රජයේ නිලධරයෙක්" යන වචන වෙනුවට "යම් ධූරයක් දරන්නා වූ, රජයේ නිලධරයක් හෝ ශ්‍රී ලංකා රාජ්‍ය විගණක සේවයේ සාමාජිකයෙක්" යන වචන ආදේශ කිරීමෙන්.

(3) එකී ඡේදයේ (viii) වන අයිතමයේ, "යම් ධූරයක් දරන්නාවූ රජයේ නිලධරයෙක්" යන වචන වෙනුවට, "යම් ධූරයක් දරන්නා වූ, රජයේ නිලධරයෙක් හෝ ශ්‍රී ලංකා රාජ්‍ය විගණක සේවයේ සාමාජිකයෙක්" යන වචන ආදේශ කිරීමෙන් සහ

(4) එකී ඡේදයේ (xii) වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීම මගින් :-

"(xiii) වෙනත් රටක ද පුරවැසියකු වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු";".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**23.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ, "තිහ" යන්නට, "තිස්පහ" යන්න ආදේශ කිරීමෙන්;

(2) එකී ව්‍යවස්ථාවේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඇ) ඔහු, ජනතාව විසින් ජනාධිපති ධූරයට දෙවරක් තෝරා පත් කොටගනු ලැබ ඇත්නම්", සහ

(3) එකී ව්‍යවස්ථාවේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**24.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාව, එකී ව්‍යවස්ථාවේ අවසානයට පහත දැක්වෙන අලුත් අනු ව්‍යවස්ථාව එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(14) මේ ව්‍යවස්ථාවේ (13) වන අනු ව්‍යවස්ථාවෙන් සලසා ඇති පරිදි හැර, යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ

ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නා වූ තම සාමාජිකයකුට එරෙහිව ගන්නා ලද හෝ ගැනීමට යෝජිත යම් විනය ක්‍රියාවක් විභාග කොට තීරණය කිරීමට කිසිදු අධිකරණයකට අධිකරණ බලය නොමැති අතර ඒ අනුව එවැනි ක්‍රියාවක් හෝ යෝජිත ක්‍රියාවක් වළක්වමින්, මැඩපවත්වමින් හෝ තහනම් කරමින් රිට් ආඥාවක් හෝ ඉන්ජන්ෂන් ආඥාවක් හෝ නිවැරැම් ආඥාවක් ප්‍රදානය කිරීමට කිසිදු අධිකරණයට අධිකරණ බලය නොමැත්තේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**25.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි (1) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

“(1) (මේ පරිච්ඡේදයෙහි “කොමිෂන් සභාව” යනුවෙන් සඳහන් කරනු ලබන) මැතිවරණ කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. කොමිෂන් සභාව, යම් වෘත්තීන් හි හෝ පරිපාලන හෝ අධ්‍යාපන ක්ෂේත්‍රවල හෝ, විශිෂ්ටතා හිමිකරගෙන සිටින තැනැත්තන් අතුරෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තුන් දෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය. පත් කරනු ලබන එක් සාමාජිකයකු නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් වරයකු වශයෙන් හෝ ඊට ඉහළ වූ හෝ ධූරයක් උසුලනු ලැබූ මැතිවරණ දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයකු විය යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.”; සහ

(2) එකී ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

“(7) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට කොමිෂන් සභාවට අදාළ ඔහුගේ හෝ

ඇයගේ රාජකාරි කටයුතුවලින් මාස දෙකක් නොඉක්මවන කාලයක් සඳහා තාවකාලිකව නිවාඩු දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු ඒ නිවාඩු කාලසීමාව සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය හැක්කේ ය. ඒ සෑම පත් කිරීමක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත විය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 104ආ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**26.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (4), (4අ) සහ (5) වන අනුව්‍යවස්ථා ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථා ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධන කරනු ලැබේ :-

"(4) (අ) මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් -

(i) ඒ ඡන්ද විමසීමේ දී තරග කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත් කර ගැනීම, ප්‍රවර්ධනය කිරීම හෝ වළක්වාලීමේ කාර්ය සඳහා භාවිත කිරීම;

(ii) ඒ ඡන්ද විමසීමේ දී තරග කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිත කිරීම,

කොමිෂන් සභාවේ උපදෙස් මත, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත විධානයක් මඟින්, තහනම් කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(ආ) එවැනි විධානයකට අනුකූලවීම සහ එය ක්‍රියාත්මක කිරීම, තත්කාලයේ ඒ දේපළ භාරව සිටින හෝ ඒ දේපළේ පාලනය දරන හෝ සෑම තැනැත්තකුගේ ම හෝ සෑම නිලධරයකුගේ ම කාර්යය විය යුත්තේ ය.

(5) (අ) ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම විෂයෙහි ලා නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන උපමාන, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් උචිත යයි සලකනු ලබන යම් ගුවන් විදුලි හෝ රූපවාහිනී සේවයක් පවත්වා ගෙන යන්නකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු හෝ ප්‍රකාශකයකු වෙත කලින් කල නිකුත් කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය. කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන එකී සියලුම උපමානවලට, එකී සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ ආකාරයේ ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් දිය යුත්තේ ය.

(ආ) (අ) ඡේදය යටතේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා වෙත, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා වෙත, ස්වාධීන රූපවාහිනී නාලිකාවේ සභාපතිවරයා වෙත සහ වෙනත් සියලු, රජයට අයත් හෝ රජයේ පාලනයට යටත් ගුවන් විදුලි හෝ රූපවාහිනී ව්‍යවසායයක් සහ සෑම පුද්ගලික ගුවන් විදුලි සේවා හෝ රූපවාහිනී සේවා පවත්වාගෙන යන්නකුගේ ව්‍යවසායයක් වෙත නිකුත් කරනු ලැබූ උපමාන අනුව ක්‍රියා කිරීම සහතික කෙරෙන සියලු පියවර ගැනීම, ඔවුන්ගේ කාර්යය විය යුත්තේ ය.

(ඇ) (අ) ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් උපමාන අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හෝ ස්වාධීන රූපවාහිනී නාලිකාව හෝ වෙනත්, රජයට අයත් හෝ රජයේ පාලනයට යටත් ගුවන් විදුලි හෝ රූපවාහිනී ව්‍යවසායයක් හෝ පුද්ගලික ගුවන් විදුලි සේවා හෝ රූපවාහිනී සේවා පවත්වාගෙන යන්නකුගේ ව්‍යවසායයක් හෝ විසින් උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක දී, නමින් හෝ නිලයෙන් හෝ නිසි බලධරයකු, කොමිෂන් සභාව විසින් පත් කරනු

ලැබිය හැක්කේ ය. එම නිසි බලධරයා පත් කරනු ලැබූ දින සිට, සියලු ම දේශපාලන විකාශන හෝ ඡන්ද විමසීම් කෙරෙහි බලපාන්නේ යයි කොමිෂන් සභාවේ මතය වන වෙනත් යම් විකාශනයක් හෝ සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි ගුවන් විදුලි සංස්ථාවේ හෝ රූපවාහිනී සංස්ථාවේ හෝ ස්වාධීන රූපවාහිනී නාලිකාවේ හෝ යම් රජයට අයත් වෙනත් ගුවන් විදුලි හෝ රූපවාහිනී ව්‍යවසායයක හෝ පුද්ගලික ගුවන් විදුලි සේවා හෝ රූපවාහිනී සේවා ව්‍යවසායයක හෝ කළමනාකරණය ඒ ඡන්ද විමසීම අවසන්වන තෙක් ඒ නිසි බලධරයා යටතට ගනු ලැබිය යුතු අතර නිසි බලධරයා විසින් පවරා ගන්නා ලද කළමනාකරණය හා සම්බන්ධ හෝ ඊට අදාළ කිසිදු කර්තව්‍යයක් ඒ කාල සීමාව තුළදී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ස්වාධීන රූපවාහිනී නාලිකාව හෝ වෙනත්, රජයට අයත් හෝ රජයේ පාලනයටත් වෙනත් ගුවන් විදුලි හෝ රූපවාහිනී ව්‍යවසායයක් පුද්ගලික ගුවන් විදුලි සේවා හෝ රූපවාහිනී සේවා පවත්වාගෙන යන්නාගේ ව්‍යවසායයක් හෝ විසින් ඉටු නොකළ යුත්තේ ය.

(ඈ) (ඇ) ඡේදය යටතේ පත්කරන ලද නිසි බලධරයාගේ බලතල සහ කර්තව්‍ය පාර්ලිමේන්තුව විසින් නීති මගින් සලස්වනු ලැබිය යුත්තේ ය.

(ඉ) මේ අනුව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන යම් උපමාන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළකරනු ලබන පුළුල් සංසරණයක් ඇති, දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක පළ කිරීමට කොමිෂන් සභාව කටයුතු සැලැස්විය යුතු ය.

(6) යම් ඡන්ද විමසීමක දී අපේක්ෂකයෙන්ගේ නාම යෝජනා භාරගනු ලබන දින සිට හෝ යම් ජනමත විචාරණයක් පැවැත්විය යුතු බවට වූ ප්‍රකාශයක දින සිට දින හතක් ඇතුළත යම් ගුවන් විදුලි සේවයක් හෝ රූපවාහිනී

සේවයක් පවත්වාගත යන්නකු, යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු හෝ ප්‍රකාශකයකු හෝ විසින් එකී ඡන්ද විමසීමේ දී යම් නිශ්චිත අපේක්ෂකයකුට හෝ නම් කරන ලද දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමටකට හෝ සහාය දීම හෝ, එකී ජනමත විචාරණයේදී ජනතාව වෙත යොමු කරන ලද යෝජනාවට සහාය දීම හෝ විරුද්ධවීම, තමා නියෝජනය කරනු ලබන ගුවන් විදුලි සේවයේ, රූපවාහිනී සේවයේ හෝ ප්‍රවෘත්ති පත්‍රයේ ප්‍රතිපත්තිය බව කොමිෂන් සභාවට දන්වනු ලබන එවැනි යම් සේවයක් පවත්වාගෙන යන්නාට හෝ අයිතිකරුට හෝ ප්‍රකාශකයාට මේ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවිය යුත්තේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**27.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

“(1) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙක් සිටිය යුත්තේ ය. ඒ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ නියමන් සහ කොන්දේසි මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අලුත් 104උඋ ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.

**28.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104උ ව්‍යවස්ථාව ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථාව මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104උඋ ව්‍යවස්ථාව ලෙස බලපැවැත්විය යුතු ය :-

“විධානවලට අනුකූලවීමට අපොහොසත්වීම වරදක් විය යුතු බව.

104උඋ (1) කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව -

(අ) යම් ඡන්ද විමසීමක් පැවැත්වීම හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට අදාළ යම් නීතියක් බලාත්මක කිරීම සහතික කිරීම පිණිස කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ප්‍රතික්ෂේප කරන හෝ අපොහොසත්වන; හෝ

(ආ) 104ආ ව්‍යවස්ථාවේ පිළිවෙලින් (4) වන අනු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය හෝ (5) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධානයන් හෝ උපමාණ සමග අනුකූලව කටයුතු කිරීමට, අපොහොසත්වන,

යම් රජයේ නිලධරයකු වරදකට වරදකරු වන අතර, වරදකරු කිරීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුම් දෙකටම හෝ යටත් වන්නේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත සෑම මහාධිකරණයකටම (1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාගකොට තීරණය කිරීමට අධිකරණ බලය ඇත්තේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරිම.

**29.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (1) අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(1) අග්‍රවිනිශ්චයකාරවරයා ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා ද ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ වෙනත් සෑම විනිශ්චයකාරවරයෙක් ද ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත්කරනු ලබන්නා හ.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

**30.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ :-

"වැඩබැලීමේ පත්වීම්."

109. (1) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක්

නිසා හෝ ස්වකීය ධූරයේ බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට අග්‍රවිනිශ්චයකාරවරයා හෝ අභියාචනාධිකරණයේ සභාපතිවරයා හෝ තාවකාලිකව අපොහොසත්වේ නම්, එම කාලසීමාව තුළ පිළිවෙළින් අග්‍ර විනිශ්චයකාර ධූරයේ හෝ අභියාචනාධිකරණයේ සභාපති ධූරයේ හෝ වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නැතහොත් අභියාචනාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයකු පත් කළ යුත්තේ ය.

(2) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධූරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු හෝ අභියාචනාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු හෝ තාවකාලිකව අපොහොසත් වේ නම්, ඒ කාලසීමාව තුළ පිළිවෙලින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන් හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන් හෝ වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව වෙනත් විනිශ්චයකාරවරයකු පත් කරනු ලැබිය හැක්කේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

**31.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ :-

“අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය.

111ඇ. (1) (මේ පරිච්ඡේදයෙහි “කොමිෂන් සභාව” යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකරණ සේවා කොමිෂන් සභාවක් වන්නේ ය. කොමිෂන් සභාව අග්‍රවිනිශ්චයකාරවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයන් දෙදෙනාගෙන් සමන්විත වන්නේ ය.

(2) අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයන් දෙදෙනා මුල් අවස්ථා අධිකරණයක විනිශ්චයකාරවරයෙකු ලෙස සේවයේ යෙදී සිටීමේ පළපුරුද්ද නොමැති තැනැත්තන්වන අවස්ථාවක දී කොමිෂන් සභාව, අග්‍රවිනිශ්චයකාරවරයා ගෙන් ද ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයාගෙන් ද සහ මුල් අවස්ථා අධිකරණයක විනිශ්චයකාරවරයකු ලෙස පළපුරුද්ද ලද එකී ශ්‍රේෂ්ඨාධිකරණයේ ඊළඟ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයාගෙන් සමන්විත විය යුතු ය.

(3) අග්‍රවිනිශ්චයකාරවරයා කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය.".

**32.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (5) සහ (6) අනුව්‍යවස්ථා ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථා ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

"(5) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට, ඔහුගේ හෝ ඇයගේ කාර්යයන්ගෙන් නිවාඩු දෙනු ලැබිය හැකි අතර, එසේ නිවාඩු දෙන ලද කාලසීමාව සඳහා කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයකු වීමට, කොමිෂන් සභාවේ සාමාජිකත්වය ලැබීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

(6) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය සහිතව කොමිෂන් සභාවේ කවර වූ හෝ සාමාජිකයකු හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය.".

**33.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.*

**34.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123 වන ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව ඉවත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 124 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.*

**35.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 124 වන ව්‍යවස්ථාව, එහි "120, 121 සහ 122 වන ව්‍යවස්ථාවල විධිවිධාන සලසා ඇති පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "120 සහ 121 වන ව්‍යවස්ථාවල විධිවිධාන සලසා ඇති පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.*

**36.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129 වන ව්‍යවස්ථාව පහත දක්වා ඇති පරිදි මෙයින් සංශෝධන කරනු ලැබේ :-

(1) එකී ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව ඉවත් කිරීම මගින්; සහ

(2) එකී ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව, "ඒ මතය, තීරණය සහ වාර්තාව" යන වචන වෙනුවට "මතය සහ වාර්තාව" යන වචන ආදේශ කිරීමෙන්.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 134 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.*

**37.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 134 වන ව්‍යවස්ථාව එහි "121, 122, 125" යන ඉලක්කම් වෙනුවට "121, 125" යන ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.*

**38.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 වන ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(2) (අ) අනපේක්ෂිත හදිසි වියදමක් දැරීමට අවශ්‍ය බව ද,

(ආ) එවැනි යම්කිසි වියදමක් සඳහා ප්‍රතිපාදන සලසා නොමැති බව ද,

මුදල් විෂයය භාර අමාත්‍යවරයාට අවබෝධ වුවහොත් අග්‍රාමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව අවිනිශ්චිත අවස්ථා

අරමුදලෙන් අත්තිකාරම් මුදලක් ගෙවීමෙන් ඒ වියදමට අවශ්‍ය මුදල සැපයීමට නියෝග කිරීමේ බලය මුදල් විෂයය භාර අමාත්‍යවරයාට ඇත්තේය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**39.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

“(1) විගණකාධිපතිවරයයෙක් වන්නේය. විගණකාධිපතිවරයා ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේ ය. විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටිනතාක් ස්වකීය ධූරය දරන්නේ ය.”.

(2) එකී ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

“(4) විගණකාධිපතිවරයාට සිය ධූරයෙහි කාර්ය ඉටු කිරීමට නොහැකි වූ විට විගණකාධිපතිවරයා වෙනුවෙන් වැඩ බැලීම සඳහා තැනැත්තකු ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ, 153ආ, 153ඇ, 153ඈ, 153ඉ, 155ඊ, 153උ සහ 153ඌ අලුත් ව්‍යවස්ථා ඇතුළත් කිරීම.

**40.** පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාවට ඉක්බිතිවම ඇතුළත් කරනු ලබන අතර ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ, 153ආ, 153ඇ, 153ඈ, 153ඉ, 153ඊ, 153උ සහ 153ඌ යන ව්‍යවස්ථා ලෙස බලපැවැත්විය යුත්තේ ය :-”

විගණන සේවා කොමිෂන් සභාවේ සංයුතිය.

153අ (1) (මේ පරිච්ඡේදයේ “කොමිෂන් සභාව” යනුවෙන් හඳුන්වනු ලබන) විගණන සේවා කොමිෂන් සභාවක් පැවතිය යුතු අතර එකී කොමිෂන් සභාව එකී සභාවේ සභාපතිවරයා විය යුතු

විගණකාධිපතිවරයාගෙන් සහ ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් ද සමන්විත විය යුත්තේ ය :-

(අ) නියෝජ්‍ය විගණකාධිපතිවරයාගේ ශ්‍රේණියට ඉහළින් වූ ධුරයන් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන් දෙදෙනෙකු;

(ආ) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවයකු; සහ

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවාවේ විශ්‍රාමලත් 1 වන පන්තියේ නිලධරයකු.

(2) (අ) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරන ලද තැනැත්තකු -

(i) ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් කලින් ඉල්ලා අස්වුවහොත්;

(ii) මෙහි පහත විධිවිධාන සලසා ඇති පරිදි ධූරයෙන් ඉවත් කළහොත්;

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ, පළාත් සභා සභිකයකු හෝ පළාත් පාලන ආයතන සභිකයකු හෝ වුවහොත්,

මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධූර දැරිය යුත්තේ ය.

(ආ) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබූ තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත වැඩිදුර ධූර කාලයක් සඳහා පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

(3) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව (1) වන අනු ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ යම් තැනැත්තකු හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය.

(4) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය හැක්කේ ය.

(5) කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් IX පරිච්ඡේදය වන දණ්ඩනීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එකී කාර්ය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුත්තා හ.

(6) කොමිෂන් සභාවට, කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයකු සිටිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ රැස්වීම්.

153ආ. (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූර්ණය එකී සභාවේ සාමාජිකයන් තුන් දෙනෙකුගෙන් සමන්විත වන්නේ ය.

(2) පාර්ලිමේන්තුව විසින්, (1) වන අනු ව්‍යවස්ථාවට යටත්ව කොමිෂන් සභාවේ රැස්වීම් සඳහා ද, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවාවක් ස්ථාපිත කිරීම සඳහාද ඒ සඳහා සම්බන්ධිත වූ සහ ආනුශංගික වූ වෙනත් කාරණා ද සඳහා විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

කොමිෂන් සභාවේ කර්තවය.

153ඇ (1) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය කිරීම් සහ සේවයෙන් පහකිරීම් කොමිෂන් සභාවට පැවරෙන්නේ ය.

(2) (1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් කර්තව්‍ය වලට අමතරව කොමිෂන් සභාව විසින් පහත සඳහන් කාර්ය සහ කර්තව්‍ය ද ඉටුකිරීම සහ කිරීම කළ යුත්තේ ය :-

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය විගණක සේවයට අයත් සාමාජිකයන්ගේ සේවයට බඳවා ගැනීමේ පටිපාටි, ඔවුන්ගේ පත්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම්වලට අදාළ රීති අනුමත කිරීම;

(ආ) නීතිය මගින් ස්ථාපිත ජාතික විගණන සේවයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම; සහ

(ඇ) නීතිය මගින් සලකනු ලබන පරිදි වූ වෙනත් කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම හා කිරීම.

කොමිෂන් සභාවේ හෝ ශ්‍රී ලංකා විගණන සේවයේ තීරණයකට බලපෑම් කිරීම හෝ බලපෑම් කිරීමට තැත් කිරීම වරදක් බව.

153ඈ. (1) තමාගේ රාජකාරි ක්‍රියාවලියේදී නොවන අවස්ථාවකදී තමන් විසින් හෝ වෙනත් තැනැත්තකු හෝ මාර්ගයෙන්, කවර වූ හෝ ආකාරයෙන් කොමිෂන් සභාවේ තීරණයකට හෝ එකී සභාවේ යම් සාමාජිකයකුට හෝ ශ්‍රී ලංකා විගණන සේවයේ යම් නිලධරයකුට හෝ බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට තැත් කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර වරදකරු කිරීමේදී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකටම (1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය ඇත්තේ ය.

නීති කෘත්‍යවලින් මුක්තිය.

153ඉ. 126 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය පිරිනමා ඇති අධිකරණ බලයට සහ 153උ ව්‍යවස්ථාව යටතේ පරිපාලනය අභියාචන විනිශ්චයාධිකරණයට (විනිශ්චය සභාවට) ප්‍රදානය

කොට ඇති බලතලවලට යටත්ව, මේ පරිච්ඡේදය යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ කොමිෂන් සභාව වෙත වෙන්කොට දී ඇති යම් කර්තව්‍යයක් ඉටුකිරීමේ දී එකී සභාව විසින් දෙන ලද යම් නියමක් හෝ කරන ලද යම් තීරණයක් ගැන විභාග කිරීමට, ප්‍රකාශ කිරීමට, හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණයකට හෝ විනිශ්චයාධිකරණයකට බලය හෝ අධිකරණ බලය නොතිබිය යුත්තේ ය.

පිරිවැය සහ වියදම්.

153ඊ. කොමිෂන් සභාවේ පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය ඉදිරිපත් කරනු ලබන අභියාචන.

153උ. කොමිෂන් සභාව විසින් තමන් සම්බන්ධයෙන් යම් පත්කිරීම හෝ උසස් කිරීම හෝ මාරු කිරීම හෝ අදාළව හෝ යම් විනය පිළිබඳ කාරණයක් හෝ සේවයෙන් පහකිරීමක් මත යම් නියමකින් අතෘප්තියට පත් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකු විසින් එයට විරුද්ධවීම 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට අභියාචනය කිරීම කළ හැක්කේය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් තීරණයක් වෙනස් කිරීමට, සුළු වශයෙන් වෙනස් කිරීමට, හෝ ප්‍රත්‍යදිෂ්ඨ කිරීමට එකී විනිශ්චය අධිකාරියට බලය ඇත්තේ ය.

කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු බව.

153ඌ. කොමිෂන් සභාව එකී කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුකූලව පාර්ලිමේන්තුවට වගකිය යුතු ය. පිළිතුරුදීමට බැඳී සිටිය යුතුය. එසේම සෑම ලිත් වර්ෂයකදීම එහි ක්‍රියාකාරකම් පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

**41.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එකී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීම මගින්:-

"(1) විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුව වෙත පැවරී ඇති ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර ආයතන සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස් වලින් සියයට හතලික් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ආණ්ඩුවට රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන සමාගම් වල ද ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුත්තේ ය.";

(2) එකී ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාවේ, 'රාජ්‍ය සංස්ථාව, වෙළෙඳ ව්‍යාපාරය හෝ වෙනත් ව්‍යාපාරය" යන වචන යෙදෙන කවර හෝ තැනක එකී වචන වෙනුවට "(1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් රාජ්‍ය සංස්ථාව, වෙළෙඳ ව්‍යාපාරය, වෙනත් ව්‍යාපාරය හෝ සමාගම" යන වචන ආදේශ කිරීමෙන්.

(3) එකී ව්‍යවස්ථාවේ (5) වන අනු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ, "යම් රාජ්‍ය සංස්ථාවක, හෝ වෙළෙඳ ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාරයක" යන වචන යෙදෙන කවර හෝ තැනක එකී වචන වෙනුවට "යම් රාජ්‍ය සංස්ථාවක හෝ, වෙළෙඳ ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාරයක හෝ 1 වන අනු ව්‍යවස්ථාවේ සඳහන් සමාගමක" යන වචන ආදේශ කිරීමෙන්.

**42.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාව, එකී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධන කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

"(ඇ) එක් එක් තැනැත්තා මූල්‍ය, නීති, පරිපාලන, ව්‍යාපාර හෝ ශාස්ත්‍රීය ක්ෂේත්‍රවල කැපී පෙණුනු හෝ උසස් නිලතල දැරූ හෝ තැනැත්තන් විය යුතු වූ ද ප්‍රධාන ජන වර්ග තුන නියෝජනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද වෙනත් සාමාජිකයන් තිදෙනෙක්.".

**43.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එකී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

"(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත වන (මේ පරිච්ඡේදයේ " කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පොලිස් කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. එකී සාමාජිකයන් අතුරෙන් යටත් පිරිසෙයින් එක් සාමාජිකයකු නියෝජ්‍ය පොලිස්පතිවරයකු වශයෙන් ධූර දැරූ තැනැත්තකු විය යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ස්වකීය නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසනු ලැබිය හැක්කේ ය. ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත, එකී සාමාජිකයන්ගෙන් එක් සාමාජියකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුත්තේ ය."; සහ

(2) එකී ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාව ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

"(4) කොමිෂන් සභාවේ සෑම සෑම සාමාජියකු ම, මේ ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ යම් නුසුදුසුකමකට පත්වුවහොත් හෝ ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධූරයෙන් කලින් ඉල්ලා අස් වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු විෂයෙහි සිවිල් අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම් හෝ මේ ව්‍යවස්ථාවේ (6) වන අනු ව්‍යවස්ථාව යටතේ ඔහු සිය ධූරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත්කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුත්තේ ය.".

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ආ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.**

**44.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ආ ව්‍යවස්ථාව, එකී ව්‍යවස්ථාවේ අවසානයට පහත දැක්වෙන අලුත් අනු ව්‍යවස්ථාව එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(5) පොලිස්පතිවරයාට අදාළ යම් කාරණයක් සාකච්ඡා කිරීම සඳහා යෝජිත යම් රැස්වීමක් හැර, කොමිෂන් සභාවේ කවර වූ හෝ රැස්වීමකට පැමිණීමට ද සහභාගීවීමට ද පොලිස්පතිවරයාට හිමිකම ඇත්තේ ය."

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඇ වගන්තිය සංශෝධනය කිරීම.**

**45.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඇ ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ "126 වන ව්‍යවස්ථාවේ (1) වන ඡේදයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දී ඇති බලයට යටත්ව" යන වචන වෙනුවට "126 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දී ඇති බලයට යටත්ව සහ 155ඔ ව්‍යවස්ථාව මගින් පරිපාලනය අභියාචන විනිශ්චයඅධිකාරය වෙත ප්‍රදානය කොට ඇති බලතලවලට යටත්ව" යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊ වගන්තිය සංශෝධනය කිරීම.**

**46.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊ ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ "කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක හෝ යම් තීරණයකට කෙලින්ම හෝ අන්‍යාකාරයෙන්" යන වචන වෙනුවට "කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක හෝ යම්

තීරණයකට හෝ කොමිෂන් සභාව විසින් තම බලතල පවරනු ලැබ ඇති යම් පොලිස් නිලධරයකුට කෙළින්ම හෝ අන්‍යාකාරයෙන්" යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊ ව්‍යවස්ථා ඉවත් කිරීම.

**47.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. 155ඌ, 155එ, 155ඒ, 155ඔ අලුත් ව්‍යවස්ථා ඇතුළත් කිරීම.

**48.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊඊ ව්‍යවස්ථාවට ඉක්බිතිවම පහත දැක්වෙන ව්‍යවස්ථා ඇතුළත් කරනු ලබන අතර එකී ව්‍යවස්ථා පිළිවෙලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ, 155ඌ, 155එ, 155ඒ සහ 155ඔ ව්‍යවස්ථා ලෙස බලපැවැත්විය යුතු ය :-

කොමිෂන් සභාවේ බලතල.

155උ. (1) (අ) පොලිස්පතිවරයා හැර, පොලිස් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, මාරු කිරීමේ, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාමේ සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරිය යුත්තේ ය. උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම් පිළිබඳ කොමිෂන් සභාවේ බලතල පොලිස්පතිවරයා විමසා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.

(ආ) මේ ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පළාත් පොලිස් කොමිෂන් සභා පිහිටුවනු ලබන පරිදි සහ පිහිටුවනු ලබන විට ඒ පළාත් පොලිස් කොමිෂන් සභා වෙත පවරනු ලබන බලතල සහ කාර්ය හීන කිරීමක්, කොමිෂන් සභාව විසින් නොකළ යුත්තේ ය.

(2) මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තු විසින් පොලිස් නිලධරයකුට හෝ පොලිස් සේවයට හෝ විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීමේ හා

ඒවා විමර්ශනය කිරීමේ කාර්ය පටිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර, තත්කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක විධිවිධානවලට අනුකූලව සහන සලසාදිය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් සහන සලසා දීමේ දී කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයාට වහාම දැනුම් දිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාව විසින්, පොලිස්පතිවරයා විමසා -

(අ) පොලිස් නිලධරයන් බඳවා ගැනීම උසස් කිරීම සහ මාරු කිරීම පිළිබඳ පටිපාටි සකස් කිරීම;

(ආ) පුහුණුව සහ පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම;

(ඇ) ජාතික අංශයේ සහ පළාත් අංශයේ භාවිතය සඳහා අවශ්‍ය අවිආයුධ, වෙඩිද්‍රව්‍ය සහ වෙනත් උපකරණ වල ස්වභාවය සහ වර්ගය; සහ

(ඈ) චර්යා සංග්‍රහ සහ විනය පිළිබඳ පටිපාටි,

ඇතුළුව පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් වූ සියලු කාරණා සඳහා සැලසීමද නිශ්චය කිරීම ද කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ 1 වන පරිශිෂ්ටය යටතේ කොමිෂන් සභාව වෙත පරවා ඇති සියලු ම බලතල ක්‍රියාත්මක කිරීම හා සියලු කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ ඇතැම් බලතල කමිටුවකට පැවරීම.

155ඌ. (1) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ශ්‍රේණිවල පොලිස් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ සහ ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ ලා කොමිෂන් සභාව සතු බලතල කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබිය යුතු (කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත නොවන) කමිටුවක් වෙත, කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් කමිටුවක් පත් කිරීම කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේ ය.

(3) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ නම් කරනු ලබන කමිටුවක රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල ගණපූරණය, කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව විය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් ඒ රීති ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාව විසින් ඇතැම් කාර්ය පැවරීම.

155එ. (1) යම් ශ්‍රේණියක පොලිස් නිලධරයන් පත් කිරීම, ඔවුන් උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහකිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතල, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කොන්දේසිවලට සහ කාර්ය පටිපාටියට යටත්ව, පොලිස්පතිවරයා වෙත හෝ පොලිස්පතිවරයා විමසා යම් පොලිස් නිලධරයකු වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් බලතල පැවරීමක්, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුත්තේ ය.

අභියාචන කිරීමේ අයිතිය.

155ඒ. (1) කවර හෝ කාණ්ඩයකට අයත් පොලිස් නිලධරයන්ගේ උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ ඔවුන් සම්බන්ධ යම් විනය කාරණයක් හෝ ඔහු සේවයෙන් පහ කිරීමක් හෝ පිළිබඳව කොමිෂන් සභාවට ඇති බලතල කොමිෂන් සභාව විසින් 155එ ව්‍යවස්ථාව යටතේ යම් පොලිස් නිලධරයකුට පවරා ඇති අවස්ථාවක එකී පොලිස් නිලධරයා විසින් එසේ තමන්ට පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේදී දෙන ලද යම් නියමකට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනය කිරීමට පොලිස්පතිවරයාට අයිතිය ඇත්තේය.

(2) පොලිස්පතිවරයා විසින් හෝ කමිටුවක් හෝ 155ඌ සහ 155එ ව්‍යවස්ථාවල සඳහන් පොලිස් නිලධරයකු විසින් හෝ තමාගේ යම් උසස් කිරීමක් හෝ ස්ථාන මාරුවක් හෝ විනය පිළිබඳ කාරණයක් හෝ සේවයෙන් පහ කිරීමක් හෝ සම්බන්ධයෙන් කරන ලද නියමයෙන් අතෘප්තියට පත් යම් පොලිස් නිලධරයකු විසින් එකී නියමයට විරුද්ධව, කොමිෂන් සභාව විසින් අභියාචනයක් සිදු කිරීමේ දී හා විභාග කිරීමේ දී අදාළ පටිපාටි ද නියම කරනු ලැබූ කාලය ද වත්මන් කරමින් කලින් කල සාදනු ලබන රීති වලට අනුකූලව කොමිෂන් සභාවට අභියාචනය කරනු ලැබිය හැක්කේ ය.

(3) (1) වන හෝ (2) වන අනු ව්‍යවස්ථා යටතේ කරන ලද අභියාචනයක් මත දෙන ලද එකී නියම වෙනස් කිරීමේ, සුළු වශයෙන් වෙනස් කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ ස්ථිර කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ හෝ තවදුරටත් වූ හෝ වෙනත් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට නියම කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේ ය.

(5) අවස්ථාවෝචිත පරිදි මේ පරිච්ඡේදයේ 155උෟ හෝ 155එ ව්‍යවස්ථා යටතේ කමිටුවක් වෙත හෝ පොලිස්පතිවරයා වෙත හෝ පොලිස් නිලධරයකු වෙත බලතල පවරා දෙනු ලැබූ විට කොමිෂන් සභාව විසින් එසේ පවරන ලද බලතල බලාත්මකව පවතිද්දී, ඒ බලතල පැවරීම කරන ලද්දේ යම් ශ්‍රේණියක පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් ද ඒ ශ්‍රේණියේ පොලිස් නිලධරයන් සම්බන්ධයෙන්, මෙහි ඉහත විධිවිධාන සලස්වා ඇති පරිදි අභියාචනය කිරීමේ අයිතියට යටත්ව, කොමිෂන් සභාව විසින් ඒ බලතල පාවිච්චි කිරීම හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීම නොකරනු ලැබිය යුත්තේ ය.

පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත අභියාචනය කිරීම

155ඔ. තමන්ගේ උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ තමා සම්බන්ධයෙන් වූ විනය පිළිබඳ කාරණයක දී හෝ සේවයෙන් පහ කිරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරන ලද නියමකින් අතෘප්තියට පත් යම් පොලිස් නිලධරයකු විසින් ඊට විරුද්ධ අභියාචනයක්, 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ ය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමක් හෝ තීරණයක් වෙනස් කිරීමේ, සුළු වශයෙන් වෙනස් කිරීමේ හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ බලය ඒ විනිශ්චයාධිකාරයට ඇත්තේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

**49.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ :-

"දැනට බල පවත්නා රීති සහ නියෝග ශේෂ කිරීම.

155ඕ. කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලබන තෙක්, මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමේ දිනයේදී බලාත්මකව පවතින සියලු රීති, නියෝග සහ කාර්ය පටිපාටි ක්‍රියාත්මකව සහ බලාත්මකව පැවතිය යුත්තේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**50.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

"(2) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේ ය. එම කොමසාරිස්වරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධූරය දරන්නේ ය."; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (5) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

"(5) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට සිය ධූරයෙහි කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමට නොහැකි වූ කවර හෝ විටෙක එකී පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙනුවෙන් වැඩබැලීමට තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත්කළ යුත්තේ ය.".

**51.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX පරිච්ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන පරිච්ඡේද ඇතුළත් කරනු ලබන අතර ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX අ සහ XIX ආ පරිච්ඡේද ලෙස බලපැවැත්විය යුතු ය :-

XIXඅ සහ XIXආ අලුත් පරිච්ඡේද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම.

"XIX අ පරිච්ඡේදය

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව.

156අ. (1) පාර්ලිමේන්තුව විසින්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම පිණිස නීතිය මගින් සැලැස්විය යුත්තේ ය. එකී නීතිය මගින්-

(අ) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම;

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනාවක් සම්බන්ධයෙන් තමාගේම මෙහෙයවීමෙන් හෝ වෙනත් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිල්ලක් මත යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් පිළිබඳව මූලික පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විමර්ශනයක් කිරීමට විධාන කිරීම සඳහා වූ බලතල සහ අල්ලස් හෝ දූෂණවලට අදාළව, බලපවත්නා නීතිය යටතේ වැරදි සඳහා නඩු පැවරීමට ඇති බලතල ද ඇතුළු කොමිෂන් සභාවේ බලතල; සහ

(ඇ) ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ දූෂණය වැළැක්වීමට අදාළ වෙනත් යම් ජාත්‍යන්තර සම්මුති ක්‍රියාත්මක කිරීම පිණිස ගත යුතු පියවර සඳහා විධිවිධාන සැලැස්විය යුතු ය.

(2) පාර්ලිමේන්තුව විසින් එසේ සලස්වනු ලබන තෙක්, 1994 අංක 14 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව පනතින් ස්ථාපිත කොමිෂන් සභාව විසින් තමාගේ ම මෙහෙයවීමෙන් හෝ එයට කරන ලද ලිඛිත පැමිණිල්ලක් මත හෝ යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම හෝ විමර්ශනයක් කිරීම නීත්‍යානුකූල වන බවට වූ සුළු වෙනස් කිරීම් සහිතව, එකී පනත අදාළ විය යුත්තේ ය.

## XIX ආ පරිච්ඡේදය

### ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.

156ආ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වූ ද (මේ පරිච්ඡේදයේ 'සභාව' යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. එකී සභාවේ යටත් පිරිසෙයින් සාමාජිකයන් තිදෙනෙකු ප්‍රතිසම්පාදනය, ගණකාධිකරණය, නීතිය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පිළිගත් අත්දැකීම් සහිත තැනැත්තන් විය යුතු ය. ජනාධිපතිවරයා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුත්තේ ය.

(2) සභාවේ සෑම සාමාජිකයකු ම විසින් ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධූරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත හේතු දක්වා ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වශයෙන් තේරී

පත්වුවහොත් හෝ ඔහු විෂයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවසථාවේ 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබුවහොත් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සෑම සාමාජිකයකුට ම, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ දීමනාවක් ගෙවිය යුත්තේ ය. එකී දීමනාව ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර එකී සභාපතිවරයාගේ හෝ සාමාජිකයාගේ ධුර කාලය අතරතුර අඩු නොකළ යුත්තේ ය.

සභාවේ කර්තව්‍ය.

156ඇ. (1) සියලු රජයේ ආයතන විසින් භාණ්ඩ සහ සේවා ප්‍රතිසම්පාදනය කරනු ලැබීම සම්බන්ධයෙන් සාධාරණ, යුක්ති සහගත, විනිවිද පෙනෙන සුළු, තරඟකාරී සහ වියදම් සඵලතාවයකින් යුත් පටිපාටි සකස් කිරීම, කොමිෂන් සභාවේ කර්තව්‍ය වන්නේ ය.

(2) (1) වන අනු ව්‍යවස්ථාවේ පොදු භාවයට අගතියක් නොමැතිව-

(අ) රජයේ ආයතන විසින් කරනු ලබන භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය, පූර්වයේ අනුමත වූ ක්‍රියාකාරී සැලැස්මවලට අනුකූලව පිළියෙල කරන ලද ප්‍රතිසම්පාදන ක්‍රම මත පදනම්ව ඇත් ද යන්න පිළිබඳව නියමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ආ) රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා සැපයීම සඳහා වූ සියලු සුදුසුකම් ලත් ලංසු කරුවන්ට එකී භාණ්ඩ හා සේවා සැපයීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියට සහභාගීවීම පිණිස සමාන අවස්ථා ලබාදී ඇත් ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ඇ) රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තේරීමේ සහ කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රියා පටිපාටිය සාධාරණ හා විනිවිද පෙනෙන සුලු වන්නේ ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ඈ) රජයේ ආයතන විසින් කරනු ලබන ඉහළ වටිනාකමින් යුත් ප්‍රතිසම්පාදනයන්ට සම්බන්ධිත සැපයුම් කමිටු සහ තාක්ෂණික ඇගයුම් කමිටුවල සාමාජිකයින් යෝග්‍ය පරිදි සුදුසුකම් ලබා ඇත් ද යන්න පිළිබඳව වාර්තා කිරීම; සහ

(ඉ) රජයේ ආයතන විසින්, පිළිගත් පටිපාටිවලින් සහ මෙහෙයුම් නිර්ණායක වලින් බැහැරව කරන ලද ප්‍රසම්පාදන වාර්තා විමර්ෂනය කිරීම සහ එකී ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වගකිව යුතු නිලධරයන් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ බලධාරීන්ට වාර්තා කිරීම;

සභාවේ කාර්තව්‍ය වන්නේ ය.

කොමිෂන් සභාවේ බලතල.

156ඈ. (1) කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුට, ලිඛිත දැන්වීමක් මගින් -

(අ) ප්‍රශ්න කරනු ලැබීම සඳහා කොමිෂන් සභාව ඉදිරියට පැමිණිය යුතු බවට;

(ආ) එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන්නාවූ ද එකී තැනැත්තාගේ සන්තකයේ හෝ පාලනයේ තිබෙන්නාවූ ද යම් ලේඛනයක් හෝ දෙයක් සභාවට ඉදිරිපත් කළ යුතු බවට,

නියාමනය කරනු ලැබිය හැක්කේ ය.

(2) (අ) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ යවනු ලැබූ දැන්වීමක් මගින් කොමිෂන් සභාව ඉදිරියට පැමිණිය යුතු බවට නියම කරනු ලැබ සාධාරන හේතුවක් නොමැතිව එකී සභාව ඉදිරියට පැමිණීමට අපොහොසත් වන;

(ආ) එවැනි දැන්වීමකට අනුකූලවෙමින් කොමිෂන් සභාව විසින් ඔහුට හෝ ඇයට ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරුදීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන; හෝ

(ඇ) (1) වන අනුව්‍යවස්ථාව යටතේ ඔහුට හෝ ඇයට යවනු ලැබූ දැන්වීමක් මගින් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ යම් ලේඛනයක් හෝ දෙයක්, සාධාරණ හේතුවක් නොමැතිව, ඉදිරිපත් කිරීමට අපොහොසත්වන හෝ ප්‍රතික්ෂේප කරන,

සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුත්තේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ සෑම මහාධිකරණයකටම ඉහත (2) වන අනුව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාග කොට තීරණය දීමට අධිකරණ බලය ඇත්තේ ය.

සභාවේ රැස්වීම්.

156ඉ. (1) කොමිෂන් සභාව, එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි කවර හෝ වාර ගණනක් රැස්විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුත්තේය. කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා සභාපතිවරයා නොපැමිණි විට දී පැමිණ සිටින සාමාජිකයින් විසින් තමන් අතුරෙන් සාමාජිකයකු එකී රැස්වීම සඳහා තෝරා පත්කර ගත යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වන්නේ ය.

(4) කොමිෂන් සභාවේ තීරණ, එකී තීරණ ගනු ලබන්නේ යම් රැස්වීමකදී ද, එකී රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් විය යුත්තේ ය. ඡන්ද සමාන වන විටක සභාපතිවරයාට හෝ එකී රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයකුට තීරක ඡන්දයක් ඇත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ ඉහත විධිවිධානවලට යටත්ව කොමිෂන් සභාව විසින් එහි රැස්වීම්, සහ එකී රැස්වීම්වල කටයුතු පිළිබඳ පටිපාටි නිශ්චය කරගනු ලැබිය හැක්කේ ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම නොතකා කටයුතු කිරීමට කොමිෂන් සභාවට බලය ඇති අතර එවැනි පුරප්පාඩුවක් තිබීමේ හේතුව හෝ යම් සාමාජිකයකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීම හෝ නිසාම පමණක් කොමිෂන් සභාවේ ක්‍රියාවන්, පටිපාටියක් හෝ තීරණයක් බලරහිත නොවිය යුත්තේ ය. බලරහිත වන ලෙස නොසැලකිය යුත්තේ ය.

**සභාවේ කාර්ය මණ්ඩලය.**

156ඊ. (1) කොමිෂන් සභාව විසින්, එය විසින් නිශ්චය කරගනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත, එහි කාර්ය නිසි පරිදි ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන පරිදි මහලේකම්වරයකු ද, වෙනත් යම් නිලධරයන් ද කොමිෂන් සභාවට පත්කරගනු ලැබිය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් සහ නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔහුගේ හෝ ඇයගේ කාර්ය හෝ කර්තව්‍ය ඉටුකිරීමේ දී හෝ කිරීමේ දී සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඔහුට හෝ ඇයට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ නඩු කටයුත්තක් හෝ වෙනත් කෘත්‍යයක් පැවරිය නොහැක්කේ ය.

**සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු බව.**

156උ. කොමිෂන් සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

**අර්ථ නිරූපණය.**

156ඌ. මේ පරිච්ඡේදයේ 'රජයේ ආයතනය' යන්නට, රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් පාලන ආයතනයක්, රජයට පවරා ගත් යම් ව්‍යාපාරයක් හෝ රජයට පවරා ගත් වෙනත් ව්‍යාපාර ආයතනයක් සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලබන්නා වූ ද රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් සියයට හතළිහකට වැඩි ප්‍රතිශතයක කොටස් දරන්නා වූ යම් සමාගමක් ද ඇතුළත් වේ.

**52.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව, "රජයේ නිලධරයා" යන අර්ථ නිරූපණය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :- 170 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

"රජයේ නිලධරයා" යන්නෙන් අධිකරණ නිලධරයකු හැර ජනරජය යටතේ වැටුප් ලබන ධුරයක් දරන තැනැත්තෙක් අදහස් වේ; එහෙත් ඊට-

(අ) ජනාධිපතිවරයා;

(ආ) අග්‍රාමාත්‍යවරයා;

(ඇ) කථානායකවරයා;

(ඈ) අමාත්‍යවරයෙක්;

(ඉ) නියෝජ්‍ය අමාත්‍යවරයෙක්;

(ඊ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක්;

(ඌ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(එ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ඒ) මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ඔ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ඕ) විගණක සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ක) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ග) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ච) මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ජ) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ට) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ඩ) පාර්ලිමේන්තු මහලේකම්වරයා;

(ණ) ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්;

(ත) පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්; සහ

(ද) විගණකාධිපතිවරයා,

ඇතුළත් නොවන්නේ ය.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**53.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

**54.** (1) සැක දුරු කිරීම සඳහා පහත සඳහන් ලෙස ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) මේ පනත නීතිය බවට පත්වනු ලබන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින පාර්ලිමේන්තුව, එය කලින් විසුරුවා හරිනු ලැබුවහොත් මිස, 2016 අප්‍රේල් මස 21 වන දින තෙක් දිගටම ක්‍රියා කළ යුතු අතර ඉන්පසු විසිරෙන්නේ ය;

(ආ) 2015, අප්‍රේල් මස 22 වන දිනට පෙර පිළිවෙලින් ජනාධිපති ධුරය සහ අග්‍රාමාත්‍ය ධුරය දරන තැනැත්තන් එම දිනෙන් පසු, මෙම පනත මගින් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව එම ධුර දැරිය යුතු වන්නේ ය;

(ඇ) මෙම පනත නීතිය බවට පත්වීමට පෙරාතුවම වූ දිනයේ දී-

(i) අග්‍රවිනිශ්චයකාරවරයා;

(ii) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(iii) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්;

(iv) අභියාචනාධිකරණයේ සභාපතිවරයා;

(v) අභියාචනාධිකරණයේ විනිශ්චයාකරවයන්;

(vi) නීතිපතිවරයා;

(vii) විගණකාධිපතිවරයා;

(viii) පොලිස්පතිවරයා;

(ix) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වරයා; හෝ

(x) පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා,

වශයෙන් ධුර දරන සෑම තැනැත්තකු ම තවදුරටත් එම ධුර දරනු ලැබිය යුතු අතර, 41ඇ ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවට යටත්ව එම නියම හා කොන්දේසි යටතේ එම ධුරයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු වන්නේ ය.

(2) මෙම පනත නීතිය බවට පත්වීමට පෙරාතුවම වූ දිනයේ දී-

(අ) පාර්ලිමේන්තු සභාවේ;

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ;

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ;

(ඈ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ;

(ඉ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ; හෝ

(ඊ) මුදල් කොමිෂන් සභාවේ,

සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ ලෙස ධුර දරන සෑම තැනැත්තකු ම මෙම පනත නීතිය බවට පත්වන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි ධුර දැරීම අවසන් කරනු ලැබිය යුත්තේ ය.

(3) (අ) මෙම පනත නීතිය බවට පත්වීමට පෙරාතුවම වූ දිනයේ දී මැතිවරණ කොමසාරිස් ධුරය දරනු ලබන තැනැත්තා එම දිනයේ දී ඔහු හෝ ඇය වෙත පවරා දී තිබූ මැතිවරණ කොමසාරිස්වරයාගේ ධුරයේ සහ මැතිවරණ කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය, 103 වන ව්‍යවස්ථාව ප්‍රකාර මැතිවරණ කොමිෂන් සභාවක් ස්ථාපනය කරනු ලබන තෙක් තවදුරටත් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සිදු කළ යුතු අතර මැතිවරණ කොමිෂන් සභාව එසේ ස්ථාපනය කරනු ලබන දින සිට සහ ඉන්පසු ඒ තැනැත්තා මැතිවරණ කොමසාරිස් ධුර දැරීම අවසන් වන්නේ ය;

(ආ) 103 වන ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කරනු ලබන දිනයට පෙරාතුවම වූ දිනයේ දී මැතිවරණ කොමසාරිස්වරයා විසින් හෝ ඔහුට එරෙහිව හෝ පවරනු ලැබ, විනිශ්චයට භාජනව පවත්නා වූ සියලු සිවිල් නඩු, නඩු හා වෙනත් නඩු කටයුතු මැතිවරණ කොමිෂන් සභාව විසින්

හෝ ඊට එරෙහිව පවරනු ලැබූ සිවිල් නඩු, නඩු සහ වෙනත් නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර මැතිවරණ කොමිෂන් සභාවේ නමින් ඒවා තවදුරටත් පවත්වාගෙන යාම හා අවසන් කිරීම කරනු ලැබිය යුත්තේ ය;

(ඇ) 103 වන ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කරනු ලබන දිනයට පෙරාතුව යම් ලිඛිත නීතියක් යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් ලබාදෙන ලද යම් තීරණයක් හෝ නියමයක් හෝ නීතිය පිළිබඳ යම් රීති නියමක් මැතිවරණ කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද තීරණයක් හෝ නියමයක් හෝ නීතිය පිළිබඳ යම් රීති නියමක් ලෙස සලකනු ලැබිය යුත්තේය;

(ඈ) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ යම් ලිඛිත නීතියක හෝ යම් කොන්ත්‍රාත්තුවක, ගිවිසුමක හෝ වෙනත් ලේඛනයක "මැතිවරණ කොමසාරිස්වරයා" සහ "මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුව" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ සඳහා "මැතිවරණ කොමිෂන් සභාව" යන වචන ආදේශ කරනු ලැබිය යුත්තේ ය.

(4) මෙම පනත නීතිය බවට පත්වීමට පෙරාතුවම වූ දිනයේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා-

(අ) පොලිස් නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම් සම්බන්ධ සියලු කාරණා; සහ

(ආ) පොලිස් නිලධරයන් විසින් ඉදිරිපත් කරන ලද සියලු අභියාචනා,

එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි 155අ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඒවා තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(5) මෙම පනත නීතිය බවට පත්වීමට පෙරාතුවම වූ දිනයේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයන්ගේ පත්කිරීම්, උසස්වීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම් පිළිබඳ සියලු කාරණා; සහ එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි 153අ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද විගණන සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය ලැබිය යුතු අතර ඒ අනුව විගණන සේවා කොමිෂන් සභාව ඒවා සම්බන්ධයෙන් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

ඇතැම් ව්‍යවස්ථා බලාත්මක භාවයට පත්වන දිනයේ දී ආරම්භවන කාල පරිච්ඡේදයට අදාළවන විශේෂ විධිවිධාන.

**55.** මේ පනතේ 3, 4, 5, 6, 7, 8, 9, 11, (එමගින් ඇතුළත් කරන ලද 46 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව හැර) 17, 19, 20, 21, 23, 33, 34, 35, 36, 37 සහ 38 වන වගන්තිවල විධිවිධාන බලාත්මක වන දිනයෙන් ආරම්භව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කිරීම සඳහා වූ ඊලඟ මහ මැතිවරණය පවත්වා අවසන් කරනු ලබන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ දී-

(අ) ජනාධිපතිවරයා සියලු අමාත්‍ය මණ්ඩල රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය; සහ

(ආ) ජනාධිපතිවරයා විසින් අග්‍රමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ඔහු හෝ ඇය වෙත යම් විෂයයක් හෝ කර්තව්‍යයක් පවරා ගත හැකි අතර එවැනිම එකඟත්වය ඇතිව ඔහුගේ හෝ ඇයගේ භාරයේ තබාගත යුතු අමාත්‍යාංශ තීරණය කරනු ලැබිය හැක්කේ ය.

ධුරයේ සිටින ජනාධිපතිවරයා ඇතැම් විෂයය සහ කර්තව්‍ය භාරව සිටීම.

**56.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන් වුව ද මේ පනත නීතිය බවට පත්වනු ලබන දිනයෙන් ආරම්භ වූ මේ පනත නීතිය බවට පත්වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ජනාධිපති ධුරය දරන තැනැත්තා ජනාධිපති ධුරය දරන තාක් කල්, පහත දක්වා ඇති විධිවිධාන අදාළ විය යුතු ය :-

(අ) ජනාධිපතිවරයා විසින් රාජ්‍ය ආරක්ෂාව, මහවැලි සංවර්ධනය සහ පරිසරය යන විෂය සහ ඒවායේ කර්තවය තමන් වෙත පවරා ගැනීම ද, එකී කාර්යය සඳහා තම භාරයේ තබාගත යුතු අමාත්‍යාංශ නිශ්චය කිරීම ද කරනු

ලැබිය හැකි අතර ඒ අනුව එකී විෂය හෝ කර්තව්‍ය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාට යම් ලිඛිත නීතියක කරනු ලබන යම් සඳහනක් ජනාධිපතිවරයාට කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුත්තේ ය; සහ

(ආ) ජනාධිපතිවරයා විසින්, (අ) ඡේදය යටතේ තමා වෙත පවරා ගනු ලැබූ යම් විෂයයක් හෝ කර්තව්‍යයක් සම්බන්ධයෙන් යම් තීරණ ගැනීමේ හෝ යම් ප්‍රතිපත්තියක් නිශ්චය කිරිමේ හෝ කාර්යය සඳහා (හෝ ජාතික වැදගත් කමින් යුත් කාරණයක් සාකච්ඡා කිරීමේ කාර්යය සඳහා) අමාත්‍ය මණ්ඩලයේ රැස්වීමක් කැඳවනු ලැබිය හැකි අතර එකී අමාත්‍ය මණ්ඩල රැස්වීමේ මූලාසනය දැරිය යුත්තේ ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.